# ක්‍රිස්තියානි ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

## 10 වන ශ්‍රේණිය

(2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)




ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව.
www.nie.lk
info@nie.lk

# ක්‍රිස්තියානි ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

## 10 වන ශ්‍රේණිය

(2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව.
**www.nie.lk**
**info@nie.lk**

ක්‍රිස්තියානි ධර්මය

10 වන ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2015
ජාතික අධ්‍යාපන ආයතනය
ISBN

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව

භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

ජාතික අධ්‍යාපන ආයතනය

මහරගම

ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk

විද්‍යුත් තැපෑල : info@nie.lk

මුද්‍රණය : මුද්‍රණාලය
ජාතික අධ්‍යාපන ආයතනය.

## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව මගින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිතව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2015 වර්ෂයේ දී හයවන සහ දහවන ශ්‍රේණි සඳහා හඳුන්වාදීම කළ යුතුව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනාවන් ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලුම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූලව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිතා කරන ලදි. විවිධ විෂයයන්හි දී එකම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම් වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිතා කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනා දී අංශයන් සඳහා අවශ්‍යවන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පංති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශයන් උපකාර වනු ඇත. සිසුන්ගේ නිපුණතාවයන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන්ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළබඳව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එමනිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමඟ සමගාමීව භාවිතා කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම තුළින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමය.

මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලුම සම්පත්දායකයන් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත්කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුමයි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂය මාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන් හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස්කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශය හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය.

## විෂය මාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමැතිය**
: ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය
ජාතික අධ්‍යාපන ආයතනය

**විෂය සම්බන්ධීකරණය** : ගරු කාල්ටන් ජෝශප් ද සිල්වා පියතුමා
ව්‍යාපෘති නායක
ආගම් දෙපාර්තමේන්තුව

: ගරු රෙක්ස් කොන්ස්ටන්ටයින් පියතුමා
ව්‍යාපෘති නායක
ආගම් දෙපාර්තමේන්තුව

**උපදේශක මණ්ඩලය** : අතිගරු ඩිලෝරාජ් කනගසබේ රදගුරුතුමා
ලංකා සභාව, කොළඹ දියෝකීසිය.

අතිගරු ශාන්තා ෆ්‍රැන්සිස් රදගුරුතුමා.
ලංකා සභාව, කුරුණෑගල දියෝකීසිය.

අතිගරු ආචාර්ය ඩැනියල් එස්. ත්‍යාගරාජා රදගුරුතුමා.
දකුණු ඉන්දියානු සභාව.

ගෞ. ආචාර්ය ඒ. ඩබ්. ජෙබනේසන් දේවගැතිතුමා.
මහනායකතුමා, ශ්‍රී ලංකා මෙතොදිස්ත සභාව.

ගෞ. ප්‍රියන්ත විජේගුණවර්ධන දේවගැතිතුමා.
සංගමාධිපතිතුමා, ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය.

ගෞ. චාර්ලි ජැන්ස් දේවගැතිතුමා.
සභාපතිතුමා, ක්‍රිස්තියානි රෙපරමාදු සභාව.

ගෞ. සමන් පෙරේරා දේවගැතිතුමා.
ප්‍රෙස්බිටීරියන් සභාව.

කොමිෂනර් මැල්කම් ඉඳුරුවගේ.
ප්‍රාදේශීය මූලිකතුමා, ගැළවීමේ හමුදාව.

ගෞ. ඩබ්. පී. එබනේසර් ජෝසප් දේවගැතිතුමා.
මහ ලේකම්, ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය.

ගෞ. හේෂාන් ද සිල්වා දේවගැතිතුමා.
ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය.

එම්. සභාරංජන් මහත්මිය.
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ - ආගමික අංශය, අධ්‍යාපන අමාත්‍යාංශය.

ගෞ. ජේ. ඒ. මිහිරි ද සිල්වා සල්ගාදු දේවගැතිතුමිය.
විධායක ලේකම්, ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය, අධ්‍යාපන කොමිසම.

ගෞ. විලියම් විජේකෝන් දේවගැතිතුමා.
ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය.

**ලේඛක මණ්ඩලය :**

ගෞ. ජේ. ඒ. මිහිරි ද සිල්වා සල්ගාදු දේවගැතිතුමිය.
විධායක ලේකම්, ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය, අධ්‍යාපන කොමිසම.
දේවධර්මවේදී, දිව්‍ය ශාස්ත්‍රවේදී, ශාස්ත්‍රපති (ක්‍රිස්තියානි අධ්‍යයනය)

එල්. නිලන්ති දීපා ද සිල්වා මිය.
බප/පිලි/මෙතොදිස්ත උසස් විදුහල - මොරටුව.
ශාස්ත්‍රපති (ක්‍රිස්තියානි අධ්‍යයනය), පුහුණු ගුරු (ක්‍රිස්තියානි ධර්මය)
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා.

එම්. රදීකා සමන්ති මෙන්ඩිස් මිය.
ශා. තෝමස් විදුහල - ගල්කිස්ස.
ශාස්ත්‍රපති (ක්‍රිස්තියානි අධ්‍යයනය, ක්‍රිස්තු ධර්මය, සිංහල)
අධ්‍යාපනපති, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා.

අරුණි ඉන්දිකා පෙරේරා ජයතුංග මිය.
බිෂොප් විදුහල, කොළඹ - 3.
දේව ධර්මවේදී, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා

එම්. රේණුකා දමයන්ති මිය.
කු/ මාවතගම මධ්‍ය මහ විද්‍යාලය - කුරුණෑගල.
ශාස්ත්‍රවේදී උපාධි, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා

එම්. පී. සෙල්වනිදි පෙරේරා මිය.
වෙස්ලි විදුහල, කොළඹ - 8.
විශ්‍රාමික ගුරු උපදේශක (ක්‍රිස්තියානි ධර්මය), පුහුණු ගුරු (විද්‍යාව)

ඩී. ස්ටෙලා දර්ශනී මෙනවිය.
ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය.
දේවධර්මවේදී.

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

ක්‍රිස්තියානි ධර්මයට අනුව සාර්ථක ජීවිතයක් ගත කිරීමට අත්‍යවශ්‍ය නිපුණතා පාදක කොට ගනිමින් පාසල් අධ්‍යාපනය හරහා එම නිපුණතා සංවර්ධනය කර ගැනීමට ඉඩ ප්‍රස්ථා සලසමින් මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කර ඇත.

දැනුමින් පමණක් හිස පුරවාගෙන දැනුම් කේන්ද්‍රීය විභාග ක්‍රමයක් යටතේ ඉහළ සාමාර්ථ ලබාගැනීම පමණක් නොසෑහේ. හිස පමණක් පෝෂණය කරන අධ්‍යාපන ක්‍රමයක් සාර්ථක අධ්‍යාපන ක්‍රමයක් ලෙස සැලකිය නොහැකිය. අධ්‍යාපනය තුළින් හදවත හා අතද පෝෂණය කළ යුතුය. මේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ අදිටනින් මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කර ඇත.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පෙළ පොතට හා විෂය නිර්දේශයට අනුරූපව ලියා ඇත. එබැවින් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී මෙම සීමාවන් නොඉක්මවා කටයුතු කර ගැනීමට වගබලා ගත යුතුය.

- පාඩමට ප්‍රවේශය වඩාත් වැදගත් බැවින් ප්‍රබෝධාත්මක ආරම්භයක් ලබා දෙමින් එය හොඳින් සිදු කරන්න.
- පාඩමට ප්‍රවේශවීමට හා පාඩම සංවර්ධනය සඳහා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් පරිශීලනය කරන්න.
- සුදුසු පරිදි කණ්ඩායම් කර කණ්ඩායම් ක්‍රියාකාරකම්වල සිසුන් යොදවන්න.
- ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී වඩාත් සුදුසු ස්ථානය තෝරා ගැනීමට උනන්දු වන්න.
- මෙහි දක්වා ඇති ඉගෙනුම් ඵල වලින් සිසුන්ගේ ජීවිත පොහොනි කරලීමට කටයුතු කරන්න.
- සිසුන්ගේ විශ්වාසය වර්ධනය කිරීමට කටයුතු කරන්න.

මෙහි ඇතුළත් පාඩම්වලට යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය භාවිත කිරීම අනිවාර්ය නොවන අතර විකල්ප ඉගෙනුම් ක්‍රම, සුදුසු පරිදි භාවිත කළ හැකිය. එහෙත් නිපුණතාව හා නිපුණතා මට්ටමෙන් බැහැර නොවිය යුතුය. ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ක්‍රිස්තියානි ආගමික ආකල්ප වර්ධනය කෙරෙහි ද ප්‍රායෝගික අවස්ථා යොදා ගැනීම කෙරෙහිද වැඩි අවධානයක් යොමු කරන්න.

පාඩම ආරම්භයේ සිට අවසානය දක්වා තක්සේරුව සිදු කළ යුතු අතර හැකියා නොහැකියා අනුව ප්‍රතිපෝෂණය හා ඉදිරි පෝෂණය ලබා දිය යුතුය. බොහෝ විට කාල සටහන් සැකසීමේ දී එකවිට කාලච්ඡේද දෙකක් එකවර නොලැබෙන හෙයින් අදාළ පාඩම කළමනාකරණය කර ගැනීම ඔබ සතු වගකීමකි. අදාළ පාඩමට අපේක්ෂිත ඇගයුම, තක්සේරුව හා ඇගයීම් නිර්ණායක අනුව සකස් කර ගන්න. ඇගයීම් සිදු කිරීමේ දී ලකුණු ලබා දෙන නිර්ණායක පිළිබඳ කල්වේලා ඇතිව සිසුන් දැනුවත් කරන්න. ඔබ විසින් සිසුන්ට ලබා දෙන ලද අභ්‍යාසවල නිරවද්‍යතාව පරීක්ෂා කොට සටහන් තබන්න.

සෑම පාඩම් සටහනක් අවසානයේම යොදා ඇති ගෙදර පරිසරයෙන් යන කොටස දෙමාපිය වැඩිහිටි සහභාගිත්වය යටතේ සිදු කිරීමට යෝජිතය. ඒ සඳහා උපදෙස් විදුහල්පති මගින් ද, විෂය භාර ගුරු භවතා පංති කවවලදී ද දෙමාපියන්ට හා වැඩිහිටියන්ට ලබා දීමට කටයුතු කළ යුතුය.

**ගරු කාල්ටන් ජෝශප් ද සිල්වා පියතුමා**
ව්‍යාපෘති නායක
ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

පටුන


| | |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ පණිවුඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ පණිවුඩය | iv |
| විෂය මාලා කමිටුව | v |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස් | vii |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | ix - xxii |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1 - 55 |
| විවිධ සහය | 56 |

## විෂය හැඳින්වීම

යහ ගුණ පිරි සමාජයක් බිහි කිරීම යුගයේ අවශ්‍යතාව ය වේ. ඒ සඳහා ආගම මගින් සුවිසල් මෙහෙවරක් ඉටු කරයි. එවන් සමාජයක් කරා දරුවන් ප්‍රවිශ්ඨ කරවීම ආගමික විෂය මාලා ප්‍රතිසංස්කරණයේ අභිප්‍රායයි. පරිපූර්ණ දරුවකු තුළ දැනුම, ආකල්ප, කුසලතා පමණක් නොව අන්තර් පුද්ගල හැකියාවන් හා යහ ගුණ වර්ධනය කිරීම ද අපේක්ෂිත ය.

දරුවකුට දේව රාජ්‍යයේ ප්‍රතිපත්තීන්ට හා ගුණාංගවලට අනුකූල ව තම කිතුනු විශ්වාසය හා ඇදහිල්ල සවිමත් කර ගනිමින් ජීවමාන ක්‍රිස්තුස් වහන්සේ තම ජීවිතය තුළ විදහා දැක්වීම සඳහා ක්‍රිස්තියානි ධර්මය විෂය මාලාව සම්පාදනය කර ඇත.

ශුද්ධ බයිබලය තුළින් එළි දැක්වෙන දේව වචනය පදනම් කර ගනිමින් විශේෂිත වූ කිතුනු දැක්ම, පැවැත්ම හා සත්‍යතාවන් මත ප්‍රධාන නිපුණතා පහක් පාදක කර ගනිමින් 6-11 ශ්‍රේණි සඳහා ක්‍රිස්තියානි ධර්මය විෂය මාලාව සකසා තිබේ.

11 වන ශ්‍රේණිය අවසාන වන විට තමා දිවි ගෙවන සමාජය තුළ පැන නැගෙන අභියෝග හමුවේ නොසැලී ක්‍රියා කරන හා ක්‍රිස්තුස් වහන්සේ තුළ තම ජීවිතය ගත කරන, සමාජය ආලෝකවත් කිරීමට හැකි දේව විශ්වාසයෙන් පරිපූර්ණ, නව යොවුන් කිතුනුවකු ලොවට දායාද කිරීම මෙම විෂය මාලාවේ මුඛ්‍ය පරමාර්ථය වේ.

ශිෂ්‍ය කේන්ද්‍රිය සන්දර්භයක් හරහා ජීවිතාදර්ශයෙන් ක්‍රියා කරමින්, කිතුනු අනන්‍යතාවය දරන දේව රාජ්‍යයේ පුරවැසියන් පිරිසක් බිහි කිරීමට ඇප කැප වී ක්‍රියා කිරීම කිතුනු දහම් ගුරුවරයකුගේ මහඟු වගකීමයි. මේ සඳහා සිසුන් තුළ අදාළ නිපුණතා වර්ධනය කිරීමටත් ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ සංකල්ප හා ක්‍රියාකාරකම් සාර්ථක ලෙස යොදා ගැනීමටත් අපේක්ෂා කෙරේ.

කිතුනු සාක්ෂිය හා ස්ථිර සාර ඇදහිල්ල පෙරදැරි කරගත් ශ්‍රී ලාංකේය ජන ජීවිතය සවිමත් කරන හා ලොව නංවන විජයග්‍රාහී කිතුනුවන් රැසක් නිර්මාණය කිරීමට මෙම ක්‍රියාදාමය හරහා අවකාශ ලැබෙනු නො අනුමානය.

**ජාතික අධ්‍යාපන පද්ධතිය සඳහා අරමුණු**

**ජාතික පොදු අරමුණු**

පුද්ගලයාට හා සමාජයට අදාල වන ප්‍රධාන ජාතික අරමුණු කරා ලඟා වීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම් වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහය විය යුතුය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ලඟා කර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

1. මානව අභිමානයට ගරු සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහු විධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කරගනිමින්, ජාතික ඒකාබද්ධතාවය, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමයේ ප්‍රවර්ධනය කිරීම තුළ ජාතිය ගොඩ නැගීමේ සහ ශ්‍රී ලාංකේය අනන්‍යතාවය තහවුරු කිරීම.
2. වෙනස්වන ලෝකයක අභියෝගයනට ප්‍රතිචාර දක්වන ජාතික උරුමයේ මා හැගි දායාදයන් හඳුනා ගැනීම හා සංරක්ෂණය කිරීම.
3. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ ව දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ්වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වාගෙන යාමට සහය වීම.
4. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයනට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.
5. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.
6. පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩි දියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.
7. ශීඝ්‍රයෙන් වෙනස්වන ලෝකයක් තුළ සිදුවන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.
8. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමිකර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප සහ කුසලතා පෝෂණය කිරීම.

## පොදු නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

1. **සන්නිවේදන නිපුණතා** සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනු කාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

**සාක්ෂරතාව** සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලිව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදිව සහ නිරවුල්ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

**සංඛ්‍යා පිළිබඳ දැනුම** භාණ්ඩ, අවකාශය සහ කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

**රූපක භාවිතය** රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති හා වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** පරිගණක දැනුම සහ ඉගෙනීමේදී ද, සේවා පරිශ්‍රයන් තුළදී ද, පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම.

2. **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලි හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා සෘජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන් චිත්තවේගී බුද්ධිය

3. **පරිසරයට අදාළ නිපුණතා**

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

**සමාජ පරිසරය** ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

**ජෛව පරිසරය** සජීවි ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජී වි ත ය ට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

**භෞතික පරිසරය** අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව ප හ සු ව , ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත්වීම සඳහා මෙවලම් හා තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

4. **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

ආර්ථික සංවර්ධනයට දායක වීම. තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම.

හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

5. **ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

6. **ක්‍රීඩාව හා විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

7. **ඉගෙනීමට ඉගෙනුම් පිළිබඳ නිපුණතා**

සීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදීව හා සාර්ථකව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම.

ඉහත ජාතික අරමුණු හා මූලික නිපුණතා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ඇතුළත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2003 දෙසැම්බර් වාර්තාවෙන් උපුටා ගැනිණ.

## විෂය අරමුණු

1. දෙවියන් වහන්සේ සියල්ලේ කර්තෘවරයාණෝ ද, නිර්මාතෘ ද බව විශ්වාස කරමින් උන්වහන්සේ අපට දුන් දේව දායාදයන් ප්‍රයෝජන ගැනීමටත්, සුරැකීමටත්, සංරක්ෂණය කිරීමටත් ක්‍රියා කරයි.

2. යාච්ඤාවෙන් සවිමත් වීම තුළ ක්‍රිස්තුස් වහන්සේගේ අසීමිත ප්‍රේමය අත්දකිමින් සමාජය ආලෝකවත් කිරීමට කටයුතු කරයි.

3. ශුද්ධාත්මයාණන් වහන්සේගේ මග පෙන්වීමෙන් තම දක්ෂතා, හැකියා යහපත් සමාජ මෙහෙවරකට හා ජාතික සංවර්ධනයට යොමු කිරීමට ක්‍රියා කරයි.

4. ජාතික හා අන්තර් ආගමික සුහදතාවය වර්ධනය කර ගනිමින් සාර ධර්මයෙන් හෙබි සදාචාරාත්මක සමාජයක් ගොඩනැගීමට දේව රාජ්‍යයේ වටිනාකම් පිටිවහලක් කර ගනියි.

5. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීමට දේව වචනය අත්වැලක් කර ගනියි.

6. පරිණත කිතුනු ජීවිත ක්‍රියාකාරීත්වය තුළින් ක්‍රිස්තුස් වහන්සේ ලොවේ මාංශවත් කරයි.

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 01.<br>දෙවියන් වහන්සේ සියල්ලේ කර්තෘවරයාණෝ ද නිර්මාතෘ ද බව විශ්වාස කරයි. | 10.1.1<br>**පැරණි ගිවිසුම තුළින් කිතු උපත පිළිබඳ දිවැස්වැකි අනාවරණය කර ගනියි.** | 10.1.1<br>ක්‍රිස්තු උපත පිළිබඳ දිවැස් වැකි (යෙසායා 7: 14 යෙසායා 11: 1, යෙසායා 9: 2,6,7, මීකා 5: 2) | ● කිතු උපත පිළිබඳ පැරණි ගිවිසුමේ සඳහන් දිවැස් වැකි ගොනු කරයි.<br>● ප්‍රකාශ කරන ලද දිවැස් වැකි ඉෂ්ඨ වූ බව පිළිගනියි.<br>● දිවැස් වැකි නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>● කිතු උපත මානව සංහතියට සුභාරංචියක් වූ බව විශ්වාස කරයි.<br>● කිතු උපත පිළිබඳ ව සුභාරංචිය අන් අයට ප්‍රකාශ කරයි. | 2 |
| | 10.1.2<br>**විශිෂ්ට සේවාවන් පිළිබඳ දිවැස්වැකි අධ්‍යයනය කරයි.** | 10.1.2<br>සේවය පිළිබඳ දිවැස් වැකි (යෙසායා 53:4.5 යෙසායා 42:4, මලාකි 3:1 යෙසායා 61:1, 40:3-4) | ● විශිෂ්ඨ සේවාවන් පිළිබඳ ව දිවැස් වැකි විස්තර කරයි.<br>● සේවයේ විශිෂ්ඨත්වය පිළිබඳ ඉදිරිපත් කර ඇති දිවැස් වැකි පිළි ගනියි.<br>● දිවැස් වැකි නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඇසුරෙන් ඉදිරිපත් කරයි.<br>● විශිෂ්ඨ වූ සේවාවක යෙදිය යුතු බව විශ්වාස කරයි.<br>● සාමූහිකව සේවයේ යෙදෙයි. | 2 |
| 02.<br>ජේසුස් වහන්සේගේ පරිපූර්ණ ජීවිතය හා සේවය තුළින් දිවි මග ආලෝකවත් කර ගනියි. | 10.2.1<br>**දේව සැලැස්මට අවනත ව ක්‍රියා කරයි.** | 10.2.1<br>විශේෂ උපත් දැනුම්දීම (ශු.ලූක් 1: 5-56) (ජේසුස් වහන්සේ, ස්නාවක ජොහාන්) | ● විශේෂ උපත් පිළිබඳව විස්තර කරයි.<br>● අපට ද දේව සැලැස්ම අනාවරණය වන බව පිළි ගනියි.<br>● නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඉදිරිපත් කරයි.<br>● දේව කැමැත්තට හිස නැමීමට යොමු වෙයි.<br>● දේව මග පෙන්වීම ලබමින් සාමූහිකව දිවි ගෙවයි. | 2 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 10.2.2<br>විශේෂ උපත් මගින් ජීවිත ආලෝකවත් කර ගනියි. | 10.2.2 විශේෂ උපත් සිදුවීම (ශු.ලූක් 1: 57 - 2: 20) | ● ස්නාවක ජොහාන් තුමාගේ හා ජේසුස් වහන්සේගේ උපත පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>● ජේසුස් වහන්සේගේ උපත තුළින් දේව පොරොන්දුව ඉටු වූ බව පිළිගනියි.<br>● නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඉදිරිපත් කරයි.<br>● සුබසුනට නිසි ප්‍රතිචාර දක්වයි.<br>● සුභාරංචියට සාක්ෂි දරයි. | 2 |
| | 10.2.3<br>කිතුනු දරුවකු ලෙස ශ්‍රී ලාංකේය සිරිත්වලට ගරු කරයි. | 10.2.3 ජේසුස් වහන්සේ වෙනුවෙන් ජුදෙව් චාරිත්‍ර (ශු.ලූක් 2: 21-52) | ● ජේසුස් වහන්සේ වෙනුවෙන් තම මව්පියන් ඉටුකළ ජුදෙව් චාරිත්‍ර පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>● ජේසුස් වහන්සේ දරුවකු ලෙස දෙමාපියන්ට කීකරුව හැදී වැඩුණු බව පිළි ගනියි.<br>● නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඉදිරිපත් කරයි.<br>● ශ්‍රී ලාංකේය සිරිත් වලට ගරු කරයි.<br>● කිතුනුවන් ලෙස ශ්‍රී ලාංකේය අනන්‍යතාව ඇතිව ජීවත් වෙයි. | 2 |
| | 10.2.4 ස්නාවක ජොහාන්තුමාගේ මනස්ථාපනයේ පණිවුඩය ජීවිතයට අදාළ කර ගනියි. | 10.2.4 ස්නාවක ජොහාන්තුමාගේ මෙහෙය පෙරමග දූත සේවය (ශු.ලූක් 3: 1-20) | ● ස්නාවක ජොහාන්තුමා ජනතාවට කළ ඉගැන්වීම් පිළිබඳ කරුණු ගොනු කරයි<br>● යහපත ඉටු කිරීමෙන් සමාජය ගොඩනැගිය හැකි බව පිළි ගනියි<br>● නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඉදිරිපත් කරයි.<br>● තම ජීවිත පැවැත්මෙන් අන් අයට ආදර්ශයක් වෙයි.<br>● අප සතු දේවල් බෙදා ගත යුතු බව පිළි ගනියි | 3 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 10.2.5<br>ජේසුස් වහන්සේගේ සේවයේ පරමාර්ථ ආදර්ශයට ගනියි. | 10.2.5<br>ජේසුස් වහන්සේගේ සේවය ඇරඹීම<br>නාසරෙත් දේශනාව - (ශු.ලූක් 3:23, 4:14-30) | ● නාසරෙත් හි ජේසුස් වහන්සේ කළ දේශනය පිළිබඳව කරුණු ගොනු කරයි.<br>● ජේසුස් වහන්සේගේ සේවයේ අරමුණ දේව රාජ්‍යය ප්‍රකාශ කිරීම බව විශ්වාස කරයි.<br>● නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඉදිරිපත් කරයි.<br>● විවිධ සමාජ අභියෝගතා ඉදිරියේ නොසැලී ක්‍රියා කරයි.<br>● සාමූහික ව අභියෝග ජය ගනියි. | 1 |
| | 10.2.6<br>දේව කැඳවීමට නිසි ප්‍රතිචාර දක්වයි. | 10.2.6<br>ජේසුස් වහන්සේගේ සේවයේ විකාශනය<br>ප්‍රථම ශ්‍රාවකයන් කැඳවීම (ශු.ලූක් 5: 1-11)<br>ශ්‍රාවකයන් 12 දෙනා තෝරා ගැනීම - (ශු.ලූක් 6 : 12 - 16)<br>ධර්මදූත සේවාව -<br>(ශු.ලූක් 9: 1-6, 10: 1-12, 17,20 පද) | ● ජේසුස් වහන්සේගේ සේවයට ගෝලයින් කැඳවීම පිළිබඳව කරුණු ගොනු කරයි.<br>● ජේසුස් වහන්සේගේ සේවයේ පංගුකාරයන් විය යුතු බව පිළිගනියි.<br>● නිර්මාණාත්මක වාර්තාවක් ඉදිරිපත් කරයි.<br>● ජේසුස් වහන්සේගේ කැඳවීමට නිසි ප්‍රතිචාර දක්වයි.<br>● එකමුතු ව සේවය කරයි. | 2 |
| | 10.2.7<br>තරාතිරම් නොබලා සැම දෙනා පිළි ගනියි. | 10.2.7<br>ජේසුස් වහන්සේගේ මෙහෙය තුළින් සමාජයට නව අරුතක්<br>පවුල් සංකල්පය- (ශු.ලූක් 8: 19 -21)<br>කාන්තාවන්- (ශු.ලූක් 8:1-3, 10:38-42 7:36-50, 8:43-48, 13:10-17)<br>සමාජයෙන් ප්‍රතික්ෂේප වූවන්- (ශු.ලූක්19: 1-10, 5: 12 -16)<br>දරුවන්- (ශු.ලූක් 9:46-48, 18: 15-17, 17:1-2) | ● ජේසුස් වහන්සේගේ කාලයේ ජීවත් වූ කාන්තාවන් හා දරුවන් පිළිබඳ කරුණු ගොනු කරයි.<br>● ජේසුස් වහන්සේ කාන්තාවන්ට හා දරුවන්ට වටිනාකමක් දුන් බව පිළි ගනියි. .<br>● නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඉදිරිපත් කරයි..<br>● තරාතිරම් නොබලා කටයුතු කරයි.<br>● සියල්ලන් සමග ප්‍රේමයෙන් දිවි ගෙවයි. | 3 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | **10.2.8**<br>**සමාජ ව්‍යුහය පිළිබඳ ව ධනාත්මක සංවාද හා ඵලදායි විවේචන මගින් ජීවිතය යහ මගට යොමු කර ගනියි.** | 10.2.8<br>ජේසුස් වහන්සේගේ මෙහෙවරට අභියෝග<br>පරිසිවරු- (ශු.ලූක් 5:17-39, 6:1-5, 11:37-44, 12:1-3, 16:14-17, 17:20-21, 14:1-6)<br>විනයධරයන්-(ශු.ලූක් 6:6-11, 11:45-54, 20: 45 -47)<br>(පරිසිවරු හා විනයධරයන් පිළිබඳ හැඳින්වීමක් කරන්න) | ● ජේසුස් වහන්සේට ජුදෙව් සමාජයේ ඇතිවූ අභියෝග පිළිබඳව කරුණු ගොනු කරයි.<br>● ජේසුස් වහන්සේ චෝදනාවලට ධනාත්මක ප්‍රතිචාර දැක්වූ බව පිළිගනියි.<br>● නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි.<br>● විවේචන සඳහා ධනාත්මක ප්‍රතිචාර දක්වයි.<br>● නිවැරදි දැක්මකින් සාමූහික ව දිවි ගෙවයි. | 3 |
| | **10.2.9**<br>**අභියෝග මැද සේවය කිරීමට දිරිය ලබයි.** | 10.2.9<br>ජේසුස් වහන්සේගේ මෙහෙවරට සද්දුසිවරුන්ගේ අභියෝග<br>ශු. ලූක් 20: 1-40<br>(සද්දුසිවරු පිළිබඳ හැඳින්වීමක් කරන්න) | ● සද්දුසිවරුන් පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>● ජේසුස් වහන්සේ එකළ සමාජයේ තිබූ ඍණාත්මක ආකල්ප වෙනස් කළ බව පිළි ගනියි.<br>● වාර්තාවන් නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි<br>● යහපත් ආකල්ප වර්ධනය කර ගනියි.<br>● අභියෝග මැද සැම දෙන සමග සහයෝගයෙන් ක්‍රියා කරයි | 2 |
| | **10.2.10**<br>**සමාජ අභියෝග මැද සහෝදරත්වයෙන් හා සහභාගිත්වයෙන් ක්‍රියා කරයි.** | 10.2.10<br>දුක් ප්‍රාප්තියට පෙර වැදගත් සිදුවීම් රජකු සේ ජෙරුසලම් දේව මාලිගයට යාම හා දේව මාලිගාව පවිත්‍ර කිරීම (ශු.ලූක් 19: 28-48)<br>අන්තිම රාත්‍රි භෝජනය හා ජූදස්ගේ කුමන්ත්‍රණය-(ශු.ලූක්22: 1-23) | ● දුක් ප්‍රාප්තියට පෙර වැදගත් සිදුවීම් පෙළ ගස්වයි.<br>● ජේසුස් වහන්සේ රජකු ලෙස පිළි ගනියි.<br>● ක්‍රියාකාරකම් නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි<br>● ජේසුස් වහන්සේගේ ශරීරයට හා රුධිරයට අප පංගුකාරයන් බව විශ්වාස කරයි<br>● ජේසුස් වහන්සේගේ ජීවිත ආදර්ශයෙන් ක්‍රියා කරයි. | 3 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 10.2.11<br>යාච්ඥාව පෙරදැරි ව දේව කැමැත්ත ඉටුකරයි. | 10.2.11<br>ඔලීව කන්ද (ගෙත්සෙමන උයන)<br>(ශු.ලූක් 22: 39-53) | ● ඔලීව කන්දේ සිදු වූ සිදුවීම් පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>● දේව කැමැත්තට ජේසුස් වහන්සේ අවනත වූ බව පිළි ගනියි.<br>● නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඉදිරිපත් කරයි<br>● නිරන්තරයෙන් දේව කැමැත්තට අවනත වෙයි.<br>● දේව කැමැත්ත අනුව සාමූහික ව දිවි ගෙවයි. | 1 |
| | 10.2.12<br>අසාධාරණත්වය ඉදිරියේ නොසැලී දිවි ගෙවයි. | 10.2.12<br>ජේසුස්ව හන්ඝ ්ග ්වි නිශ්ය , කුළ සිත ්වී ම (ශු. ලූක් 22:63-23:25, 23: 33, 44-49) | ● ජේසුස් වහන්සේගේ විනිශ්චය අවස්ථා පිළිබඳ කරුණු ගොනු කරයි.<br>● ජේසුස් වහන්සේ අප වෙනුවෙන් කුරුසිපත් වූ බව පිළිගනියි.<br>● නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඉදිරිපත් කරයි<br>● පෞද්ගලික වාසි හමුවේ වැරදි දේනොකිරීමට පෙළඹෙයි.<br>● සාධාරණ ලෙස ජීවත් වීමට වෙර දරයි. | 3 |
| | 10.2.13<br>කිතුනු දිවියට සාක්ෂි දරයි. | 10.2.13<br>ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තියට ප්‍රතිචාර දැක්වූවන් හා ජේසුස් වහන්සේගේ ප්‍රතිචාර (ශු.ලූක් 23: 34,42,46 පද)<br>පේදුරුගේ මහා ප්‍රකාශය හා අපලාපය-(ශු.ලූක් 9:18-20, 22:31-34, 22:54-62)<br>සිරේනියේ සීමොන්- (ශු.ලූක් 23:26)<br>ස්ත්‍රීන්- ශු.(ලූක් 23:27-31)<br>සොරුන්- (ශු.ලූක් 23:32-33,39-42)<br>මුර සෙබළුන් (ලූක් 23: 35-38)<br>අරිමාතියේ ජෝසෙප්- (ශු. ලූක් 23: 50-53) | ● ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තියට සම්බන්ධ වූවන් පිළිබඳ කරුණු ගොනු කරයි.<br>● ක්‍රිස්තුස් වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයා බව පිළිගනියි.<br>● නිර්මාණාත්මක පොත් පිංචක් ඉදිරිපත් කරයි<br>● හෘද සාක්ෂියට එකඟව ක්‍රියා කරයි.<br>● කිතුනු සාක්ෂිකරුවන් ලෙස ජීවත් වෙයි. | 3 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 10.2.14 ජීවමාන දෙවියන් වහන්සේ තුළ ජයග්‍රාහී ජීවිතයක් ලබයි. | 10.2.14 පුනරුජ්ජීවනය හා ස්වර්ගාරෝහණය (ශු. ලූක් 24 පරිː) | ● ජේසුස් වහන්සේගේ උත්ථානය අත්දුටු අය ගැන තොරතුරු ගොනු කරයි.<br>● ජේසුස් වහන්සේ මරණය පරාජය කොට නැවත නැගිටි බව පිළි ගනියි.<br>● නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඉදිරිපත් කරයි<br>● ජේසුස් වහන්සේ ජීවමාන තැනැන් වහන්සේ බව විශ්වාස කරයි. .<br>● නව බලාපොරොත්තුවක් ඇතිව ජයග්‍රාහී ව ක්‍රියා කරයි. | 1 |
| 03. ශුද්ධාත්මයාණන් වහන්සේ තුළින් දිරිය හා සවිය ලබමින් ජීවිත නවෝදයක් අත්දකියි. | 10.3.1 ශුද්ධාත්මයාණන් වහන්සේගේ වැඩ විසීමට විවෘත වෙයි. | 10.3.1 ජේසුස් වහන්සේගේ බව්තීස්මය (ශු. ලූක් 3ː 21, 22) | ● ජේසුස් වහන්සේ ගේ බෞතිස්මය පිළිබඳ කරුණු ගොනු කරයි.<br>● ශුද්ධාත්මයාණන් වහන්සේ නිරතුරුව ක්‍රියාකරන බව පිළිගනියි.<br>● නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඉදිරිපත් කරයි.<br>● යාච්ඤාව තුළින් ශුද්ධාත්ම ක්‍රියාකාරිත්වය අත්දැකිය හැකි බව විශ්වාස කරයි.<br>● සාමූහිකව ශුද්ධාත්මයාණන් වහන්සේට යාච්ඤා කරයි. | 1 |
| | 10.3.2 පරීක්ෂා ජය ගැනීමට ශුද්ධාත්ම මග පෙන්වීම ලබයි. | 10.3.2 ජේසුස් වහන්සේ පරීක්ෂාවන්ට මුහුණ දීම (ශු.ලූක් 4ː1-13) | ● ජේසුස් වහන්සේට පැමිණි පරීක්ෂාවන් හා ඉන් ජයගත් ආකාරය පිළිබඳ කරුණු ගොනු කරයි.<br>● පරීක්ෂාවන් ජය ගැනීමට දේව වචනය පිටිවහලක් වන බව පිළිගනියි.<br>● නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඉදිරිපත් කරයි.<br>● ශුද්ධාත්ම මග පෙන්වීමෙන් පරීක්ෂා ජයගත හැකි බව විශ්වාස කරයි.<br>● ජීවිත පරීක්ෂාවන්ගෙන් ජය ගනියි. | 1 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 10.3.3 නිවැරදි දැක්මකට අනුව ජීවිතය ගොඩ නගා ගනියි. | 10.3.3 ජේසුස් වහන්සේගේ රූප විපර්යාසය (ශු. ලූක් 9: 28-36) | ● රූප විපර්යාසය සිද්ධිය ගැඹුරින් අධ්‍යයනය කරයි.<br>● රූප විපර්යාසය සිදුවීම මගින් ශ්‍රාවකයන් නව දැක්මකට යොමු වූ බව පිළි ගනියි.<br>● නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඉදිරිපත් කරයි.<br>● ජේසුස් වහන්සේ දේව පුත්‍රයාණන් බව විශ්වාස කරයි.<br>● ජේසුස වහන්සේගේ සේවයේ කොටස්කරුවන් වෙයි. | 1 |
| 04. දේව රාජ්‍යයේ වටිනාකම් පෙරදැරි කරගෙන සදාචාරාත්මක සමාජයක් ගොඩනැගීමට දායක වෙයි. | 10.4.1 දේව රාජ්‍ය වර්ධනයට දායක වෙයි. | 10.4.1 දේව රාජ්‍ය හා එහි වර්ධනය (දේව රාජ්‍යය පිළිබඳ හැඳින්වීම) (ශු. ලූක් 8: 4-15,13: 18-21) | ● දේව රාජ්‍යයේ වර්ධනය පිළිබඳ උපමා පැහැදිලි කර ගනියි.<br>● දේව රාජ්‍යය වර්ධනය වන බව පිළිගනියි.<br>● උපමා ඇසුරෙන් දේව රාජ්‍යයේ වර්ධනය පිළිබඳ පොත් පිංචක් නිර්මාණය කරයි.<br>● වත්මන් ලොව තුළ දේව රාජ්‍යය ව්‍යාප්ත වන බව විශ්වාස කරයි.<br>● දේව රාජ්‍යයේ වර්ධනය උදෙසා එකමුතු ව ක්‍රියා කරයි. | 2 |
| | 10.4.2 දේව රාජ්‍යයේ ලකුණු හා ප්‍රාතිහාර්යය තුළින් දේව බලය අත්දකියි. | 10.4.2 ලකුණු හා ප්‍රාතිහාර්යය<br>මාරුත දමනය (ශු.ලූක් 8:22-25)<br>පන්දහසකට කෑම දීම (ශු.ලූක් 9:10 -17)<br>ජයිරස්ගේ දුව (ශු.ලූක් 8:40-42, 49-56)<br>නායින් නුවර වැන්දඹුවගේ පුතා(ශු.ලූක් 7:11-17)<br>අශුද්ධාත්ම දුරු කිරීම (ශු.ලූක් 4:31-37, 11:14-23)<br>සුව කිරීම් - ජෙරිකෝවේ අන්ධ මිනිසා (ශු.ලූක් 18:35-43)<br>ශතාධිපතියාගේ දාසයා (ශු.ලූක් 7:1-10) | ● දේව රාජ්‍යයේ ලකුණු හා ප්‍රාතිහාර්ය පිළිබඳ කරුණු ගොනු කරයි.<br>● ජේසුස් වහන්සේ බොහෝ ලකුණු හා ප්‍රාතිහාර්ය සිදු කළ බව පිළි ගනියි.<br>● දේවරාජ්‍යයේ ලකුණු හා ප්‍රාතිහාර්ය පිළිබඳ නිර්මාණාත්මක වාර්තා එළි දක්වයි.<br>● එදිනෙදා ජීවිතයේදී දේව බලය විශ්වාසයෙන් අත්දකියි.<br>● ලකුණු හා ප්‍රාතිහාර්ය අත්දකිමින් දේවරාජ්‍යයේ සේවය තුළ ක්‍රියාකාරී වෙයි. | 3 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 10.4.3<br>කිතුනු ප්‍රතිපත්ති අනුව ජීවත් වෙයි. | 10.4.3<br>දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති<br>මහා මංගල භෝජනය (ශු.ලූක් 14: 15-24)<br>නැතිවූ බැටළුවා, නැතිවූ කාසිය, නැතිවූ පුත්‍රයා (ශු.ලූක් 15:1-32) | • දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති විස්තර කරයි.<br>• දේව රාජ්‍යයේ ප්‍රතිපත්තිවලට අනුව දිවි ගෙවිය යුතු බව පිළි ගනියි.<br>• දේවරාජ්‍යයේ ප්‍රතිපත්ති ලැයිස්තුවක් නිර්මාණාත්මක ව ලියා දක්වයි.<br>• දේවරාජ්‍යයේ ප්‍රතිපත්ති අනුව දිවි ගෙවීමෙන් දිවිය යහ මගට යොමු වන බව විශ්වාස කරයි.<br>• ප්‍රතිපත්ති ගරුක ජීවිත ගත කරයි. | 2 |
| | 10.4.4<br>නිහතමානී ව තම හැකියාවන් දේව ගෞරවය උදෙසා කැප කරයි. | 10.4.4<br>දේවරාජ්‍යයේ පුරවැසියන් -<br>සේවක නායකත්වය (ශු.ලූක්22:24-30)<br>වැයවීම (ශු.ලූක්10:25-37)<br>ස්ථානෝචිත ප්‍රඥාව (ශු.ලූක්16:1-9)<br>හැකියාවන් (ශු.ලූක් 19 : 11-27) | • දේව රාජ්‍යයේ පුරවැසියන්ගේ ගුණාංග හා චරිත ලක්ෂණ පැහැදිළි කරයි.<br>• කිතුනුවන් නිහතමානී ව දේව ගෞරවය උදෙසා කැප විය යුතු බව පිළි ගනියි.<br>• නිර්මාණාත්මක නාට්‍ය පිටපතක් රචනා කරයි.<br>• යහගුණ වර්ධනය කර ගනිමින් සේවය කළ යුතු බව විශ්වාස කරයි.<br>• යහපත් සේවාවන් වල යෙදෙයි. | 3 |
| | 10.4.5<br>දේව රාජ්‍යයේ පුරවැසියන්ගේ භාර දූර කම ග්‍රහණය කර ගනියි. | 10.4.5<br>දේව රාජ්‍යයේ අභියෝගාත්මක අවස්ථා<br>ආපස්සට නො යාම (ශු.ලූක් 9:57-62)<br>වස්තුව (ශු.ලූක් 12:13-34, 18:18-30, 16:19-31)<br>භාර දූර කම (ශු.ලූක්14: 25-33)<br>නිහතමානීකම (ශු.ලූක් 18:9-14) | • දේව රාජ්‍යයේ අභියෝගාත්මක අවස්ථා පැහැදිලි කරයි.<br>• අභියෝග වලට මුහුණ දීමට සිදුවන බව පිළි ගනියි.<br>• නිර්මාණාත්මක රචනයක් ලියයි.<br>• අභියෝග ජය ගැනීමට ජේසුස් වහන්සේ දිරිය හා සවිය ලබා දෙන බව විශ්වාස කරයි.<br>• අභියෝග ජය ගනිමින් සහයෝගයෙන් ක්‍රියා කරයි. | 3 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | **10.4.6**<br>**කිතුනුවන් ලෙස නිරතුරු සූදානමින් යුතු ව කටයුතු කරයි.** | 10.4.6<br>දේව රාජ්‍ය උදෙසා නිරතුරු සූදානම<br>විශ්වාසදායක දාසයෝ<br>(ශු.ලූක් 12: 35-40)<br>මනස්ථාපනය නො වීමේ ඵල<br>(ශු.ලූක් 13: 1-9)<br>පටු දොරටුව (ශු.ලූක් 13: 22-30)<br>විශ්වාසී හා අවිස්වාසී දාසයෝ<br>(ශු.ලූක් 12: 42-48) | ● දේව රාජ්‍යයේ පුරවැසියන් නිරතුරු සූදානමින් කටයුතු කළ යුතු ආකාරය පැහැදිළි කරයි<br>● සූදානම අත්‍යවශ්‍ය බව පිළි ගනියි.<br>● ගීතිකාවක් නිර්මාණය කරයි.<br>● සූදානමින් හා කැපවීමෙන් ක්‍රියා කරන අයට සදාතන ජීවනය උරුම කර ගත හැකි බව විශ්වාස කරයි.<br>● නිරතුරු සූදානමින් කටයුතු කරයි. | 3 |
| 05.<br>ශුද්ධ බයිබලය ජීවිතයට අත්වැලක් කර ගනියි. | **10.5.1**<br>**දේව වදන් තුළින් ආලෝකයක් ලබයි.** | 10.5.1<br>මිටියාවතේ දේශනාව (ශු.ලූක් 6:17-49)<br>සැපත හා විපත (ශු.ලූක් 6:20-26)<br>සතුරන් කෙරේ මෙත් සිත් වැඩීම<br>(ශු.ලූක් 6: 27-36)<br>අනුන් විනිශ්චය (ශු.ලූක් 6: 37-42)<br>පල (ශු. ලූක් 6: 43-45)<br>අත්තිවාරම් දෙක (ශු. ලූක් 6: 46-49) | ● මිටියාවතේ දේශනය තුළ අඩංගු කරුණු වගු ගත කරයි.<br>● සතුරන් ට ප්‍රේම කළ යුතු බව පිළි ගනියි.<br>● නිර්මාණාත්මක ව ක්‍රියාකාරකම් ඉදිරිපත් කරයි<br>● දේව වචනය අනුව ජීවිතය ගොඩ නගා ගනියි.<br>● සමාජය තුළ අන් අය සමග සහයෝගයෙන් ජීවත් වෙයි. | 3 |
| | **10.5.2**<br>**ක්‍රිස්තුස් වහන්සේගේ ඉගැන්වීම් දෛනික ජීවිතයේ දී භාවිත කරයි.** | 10.5.2<br>යාච්ඤාව (ශු. ලූක් 11:1-13, 18:1-8)<br>සිරුරට පහන (ශු.ලූක් 8:16-18)<br>ආගන්තුක සත්කාරය (ශු.ලූක් 14:7-11)<br>වැන්දඹුවගේ තුති පඬුර (ශු.ලූක් 21:1-4)<br>ඇඳහිල්ල (ශු.ලූක් 17:5-10)<br>පෞද්ගලික අවශ්‍යතා ගැන කරදර වීම<br>(ලූක් 12:22-32)<br>ලුණු (ශු. ලූක් 14:34-35)<br>ස්තුතිවන්ත භාවය (ශු. ලූක් 17: 11-19) | ● ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් වලින් ඉස්මතු වන කරුණු ගොනු කරයි.<br>● ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් පිළිපැදිය යුතු බව පිළිගනියි.<br>● ප්‍රශ්න මාලාවට පිළිතුරු ලියා දක්වයි.<br>● දේවාශීර්වාද වලට තුති පුදයි.<br>● ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් අනුව එකමුතුව ක්‍රියා කරයි. | 3 |

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

**නිපුණතාව 1.0** : දෙවියන් වහන්සේ සියල්ලේ කර්තෘවරයාණෝ ද නිර්මාතෘ ද බව විශ්වාස කරයි.

**නිපුණතා මට්ටම10. 1.1** :පැරණි ගිවිසුම තුළින් කිතු උපත පිළිබඳ දිවැස් වැකි අනාවරණය කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02

**ඉගෙනුම් පල**

- කිතු උපත පිළිබඳ පැරණි ගිවිසුමේ සඳහන් දිවැස් වැකි ගොනු කරයි.
- ප්‍රකාශ කරන ලද දිවැස් වැකි ඉෂ්ට වූ බව පිළිගනියි.
- දිවැස් වැකි නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- කිතු උපත මානව සංහතියට සුභාරංචියක් වූ බව විශ්වාස කරයි.
- කිතු උපත පිළිබඳ ව සුභාරංචිය අන් අයට ප්‍රකාශ කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- කිතු උපත පිළිබඳ පැරණි ගිවිසුමේ සඳහන් දිවැස් වැකිය පන්තිය ඉදිරියේ ප්‍රදර්ශනය කරන්න.
- සිසුන් ට එම දිවැස් වැකිය හඬ නගා කියවීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
    - විශේෂ උපතක් පිළිබඳ සඳහන් බයිබල් කොටසක් බව
    - එය දිවැස් වැකියක් බව
    - දිවැස් වැකි මගින් විශේෂ උපත් දැනුම් දුන් බව.

(මිනිත්තු 15)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1 )
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 45 )

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.
    - කිතු උපත පිළිබඳව පැරණි ගිවිසුමේ සඳහන් වන බව.
    - විවිධ දිවැසිවරුන් කිතු උපත පිළිබඳව දිවැස් වැකි ප්‍රකාශ කළ බව
    - ජේසුස් වහන්සේගේ උපත පිළිබඳ දිවැස් වැකි (යෙසායා 17:14, යෙසායා 11:1, මීකා 5:2)
    - පැරණි ගිවිසුමේ සහ නව ගිවිසුමේ සඳහන් කිතු උපතේ සුවිශේෂත්වය.
    - පැරණි ගිවිසුමේ සඳහන් දිවැස් වැකි නව ගිවිසුම තුළින් ඉෂ්ඨ වූ බව.

(මිනිත්තු 20)

**ගුණාත්මක යෙදවුම් :** ශුද්ධ බයිබලය - යෙසායා 7:14, 11:1, 9:2,6,7, මීකා 5:2
නිර්මාණාත්මක ව සකසන ලද කිතු උපත පිළිබඳ සඳහන් දිවැස් වැකියක්.
පාට A4 කඩදාසි, ගම්, කතුරු, පාට පෑන්, බ්‍රිස්ටල් බෝඩ්.
ඇමුණුම 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1

## ගවේෂණය සඳහා උපදෙස්

**1 කණ්ඩායම** - යෙසායා 7:14, යෙසායා 11:1, යෙසායා 9:2, 6:7, මීකා 5:2 කියවන්න.
එම බයිබල් පාඨවල සඳහන් දිවැස් වැකි නිර්මාණාත්මක ව
පිටු පෙරළනයක් මගින් ඉදිරිපත් කරන්න.

**2 කණ්ඩායම** - බයිබලයේ පැරණි ගිවිසුමේ සඳහන් විශේෂ උපත් පිළිබඳ වෙනත්
දිවැස් වැකි 5ක් එකතු කරන්න.
ඒවා වෙන් වෙන්ව A4 කඩදාසි වල සඳහන් කරන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

පවුලේ යාච්ඤාවේ දී දිවැසිවරුන්ගේ පොත් කියවීමට යොමු කරන්න.

**නිපුණතාව 1.0** : දෙවියන් වහන්සේ සියල්ලේ කර්තෘවරයාණෝ ද නිර්මාතෘ ද බව විශ්වාස කරයි.

**නිපුණතා මට්ටම10.1.2** :විශිෂ්ට සේවාවන් පිළිබඳ දිවැස් වැකි අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02

**ඉගෙනුම් ඵල**

- විශිෂ්ට සේවාවන් පිළිබඳ ව දිවැස් වැකි විස්තර කරයි.
- සේවයේ විශිෂ්ටත්වය පිළිබඳ ඉදිරිපත් කර ඇති දිවැස් වැකි පිළි ගනියි.
- දිවැස් වැකි නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඇසුරෙන් ඉදිරිපත් කරයි.
- විශිෂ්ඨ වූ සේවාවක යෙදිය යුතු බව විශ්වාස කරයි.
- සාමූහිකව සේවයේ යෙදෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- දිවැස් වැකි ලියන ලද විශේෂ කාඩ් පත් 5ක් අනෙක් පැත්ත හරවා ගුරු මේසය මත විහිදුවා තබන්න.
- සිසුන් පස් දෙනකුට පැමිණ ඒවායින් එක බැගින් තෝරා ගෙන එය පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- පහත කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
    - සේවය පිළිබඳ විවිධ දිවැසිවරුන් දිවැසි වැකි පවසා ඇති බව.
    - එම දිවැස් වැකි මගින් දේව සැලැස්ම හඳුනා ගත හැකි බව.
    - එම දිවැස් වැකි ඉටු වී ඇති බව.

(මිනිත්තු 15)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1 )
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 45)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.

- ජේසුස් වහන්සේ දුක් පීඩා මධ්‍යයේ විශිෂ්ට සේවයක යෙදුන බව.
  යෙසායා 53: 4-5

- ජේසුස් වහන්සේගේ විශිෂ්ට සේවාව තුළ වූ යුක්ති සහගත බව.

- ස්නාවක ජොහාන් තුමා විසින් පෙරමග දූත සේවයේ යෙදීමට නියමිත බව

- ජේසුස් වහන්සේ වහලුන්ට මිදීම දානය කර බිඳුනු සිත් ඇත්තන්ට සුව සෙත සලසන බව.

- අප ද සේවයට කැඳවන බව.

(මිනිත්තු 20)

**ගුණාත්මක යෙදවුම් :** ශුද්ධ බයිබලය - යෙසායා 40:3-4, 42:4, 53:4-5, 61:1 මලාකි 3:1,
දිවැස් වැකි ලියන ලද විශේෂ කාඩ්පත්
ඇමුණුම 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාලව, ඉගෙනුම් ඵළ සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1 .**

**ගවේෂණය සඳහා උපදෙස්**

- ඔබේ කණ්ඩායමට ලැබී ඇති ශුද්ධ ලියවිලි පාඨය හොඳින් කියවන්න.
- ඒ පිළිබඳව අනෙක් අය සමග සාකච්ඡා කරන්න.
- ඒ අනුව ඔබගේ කණ්ඩායමට ලැබී ඇති ක්‍රියාකාරකමේ නිරත වන්න.

**1 කණ්ඩායම -** යෙසායා 40:3:4 බයිබල් කොටස කියවන්න.
ජේසුස් වහන්සේගේ සේවයේ විශිෂ්ටත්වය දැක්වෙන නිසඳැසක් ලියන්න
යෙසායා 42:4 බයිබල් කොටස කියවන්න.
සේවයේ විශිෂ්ටත්වය ලියා දක්වන්න.

**2 කණ්ඩායම -** යෙසායා 53: 4 - 5 බයිබල් කොටස කියවන්න.
සේවයේ විශිෂ්ටත්වය පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.
යෙසායා 61:1 කටපාඩම් පදයක් ලෙස නිර්මාණාත්මක ව සකසන්න.

**3 කණ්ඩායම -** මලාකි 3:1 බයිබල් කොටස කියවන්න.
එහි සඳහන් ආකාරයට සේවයේ විශිෂ්ටත්වය පිළිබඳව කරුණු සටහන් කර ගන්න.
ඒ පිළිබඳ කථාවක් ඉදිරිපත් කරන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

ඉරුදින දේව මෙහෙයේ කොටස් භාර ගැනීමට දරුවන් යොමු කර වන්න.

**නිපුණතාව 2.0** : ජේසුස් වහන්සේගේ පරිපූර්ණ ජීවිතය හා සේවය තුළින් දිවි මග ආලෝකවත් කර ගනියි.

**නිපුණතා මට්ටම 10.2.1** :දේව සැලැස්මට අවනතව ක්‍රියා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02

**ඉගෙනුම් පල**
- විශේෂ උපත් පිළිබඳව විස්තර කරයි.
- අපට ද දේව සැලැස්ම අනාවරණය වන බව පිළි ගනියි.
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඉදිරිපත් කරයි.
- දේව කැමැත්තට හිස නැමීමට යොමු වෙයි.
- දේව මග පෙන්වීම ලබමින් සාමූහිකව දිවි ගෙවයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පියවර : 1.

- ඇමුණුම 2 සඳහන් පුවරු සිසු දරුවන්ට ඉදිරිපත් කරමින් එම ප්‍රකාශයන් පිළිබඳ සාකච්ඡාවක් මෙහෙය වන්න.
- ස්නාවක ජොහාන් තුමාගේ හා ජේසුස් වහන්සේගේ උපත් විශේෂ උපත් වූ බව.
- විශේෂ උපත් පිළිබඳ පණිවුඩය ගාබ්‍රියෙල් දේව දූතයා රැගෙන ආ බව.
- මරියතුමිය දේව කැමැත්තට හිස නැමු බව.
- මරිය තුමිය හා එළිසබෙත් තුමිය දෙවියන් වහන්සේ කෙරෙහි පූර්ණ විශ්වාසය තැබූ බව.

(මිනිත්තු 15)

පියවර .2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න
- සෑම කණ්ඩායමකට ම ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 45 )

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.

  - ස්නාවක ජොහාන් තුමාගේ උපත නිමිත්තෙන් බොහෝ දෙන ප්‍රීති වන බව.
  - එළිසබෙත් තුමිය, මරියතුමිය ස්වාමින් වහන්සේගේ මෑණියන් ලෙස හඳුනා ගත් බව.
  - වනිතාවන් අතර අතිශයින් ආශිර්වාද ලත් තැනැත්තිය ලෙස මරියතුමිය පිළි ගත් බව.

- සමිදාණන් වහන්සේ  සලසන විමුක්තිය ගැන මරියතුමිය ප්‍රශංසා ගීතයක් ගායනා කළ බව
- අපට ද දේව සැලැස්ම අනාවරණය  වන බව
- සමාජ අභියෝග  නොතකා දේව කැමැත්තට හිස නැමිය යුතු බව.

(මිනිත්තු 20)

**ගුණාත්මක යෙදවුම් :** ශු. බයිබලය - ශු. ලූක් 1:5-56
A4  කඩදාසි හා පෑන්
ඇමුණුම: 1
ඇමුණුම: 2

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1
## ගවේෂණය සඳහා උපදෙස්

**කණ්ඩායම 1:** **ශු. ලූක් 1:5 - 25** දක්වා බයිබල් කොටස අධ්‍යයනය කරන්න.
**ස්නාවක ජොහාන් තුමාගේ උපත දැනුම් දීම** පිළිබඳ සිද්ධිය නාට්‍ය පිටපතක් මගින් ඉදිරිපත් කරන්න.

**කණ්ඩායම 2.** **ශු. ලූක් 1:26 - 56** දක්වා බයිබල් කොටස අධ්‍යයනය කරන්න.

1. **ජේසුස් වහන්සේගේ උපත දැනුම්දීම** පිළිබඳ සිද්ධිය දෙබසක් ලෙස ඉදිරිපත් කරන්න.
2. **'මරියතුමියගේ උදාන ගීයේ'** ඇතුලත් කරුණු පදනම් කර ගනිමින් ගීතයක්/ විරිදුවක්/ කවියක් නිර්මාණය කරන්න

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

## ඇමුණුම 2

'බොහෝ දෙනා ඔහුගේ උපත නිමිත්තෙන් ප්‍රීති වන්නාහ'
'ඔහු මිදියුෂ වත් මත්පැන් වත් නො බොන්නේය'
'ඔබ වනිතාවන් අතර අතිශය ආශිර්වාද ලද්දීය'
'මාගේ ස්වාමින් වහන්සේගේ මෑණියන්'
යන ප්‍රකාශ 4  ප්‍රදර්ශනය කිරීමට හැකි පරිදි පුවරුවක සකස් කරන්න.

**ගෙදර පරිසරයෙන්**

පවුලක් ලෙස එකමුතුව ශුද්ධ බයිබලය කියවීමට යොමු කරන්න.

**නිපුණතාව 2.0** : ජේසුස් වහන්සේගේ පරිපූර්ණ ජීවිතය හා සේවය තුළින් දිවි මග ආලෝකවත් කර ගනියි.

**නිපුණතා මට්ටම 10.2.2 :** විශේෂ උපත් මගින් ජීවිත ආලෝකවත් කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02

**ඉගෙනුම් පල**

- ස්නාවක ජොහාන්තුමාගේ හා ජේසුස් වහන්සේගේ උපත පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- ජේසුස් වහන්සේගේ උපත තුළින් දේව පොරොන්දුව ඉටු වූ බව පිළිගනියි.
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඉදිරිපත් කරයි.
- සුබසුනට නිසි ප්‍රතිචාර දක්වයි.
- සුභාරංචියට සාක්ෂි දරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පියවර 1.

- ගෙන එන ලද ගව ඔරුව පෙන්වන්න
- ගාබ්‍රියෙල් දේව දූතයා ගව ඔරුව කුමන විශේෂ උපත පිළිබඳ ව හඳුන්වා දීමට යොදා ගත්තේ දැයි විමසමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.

    - ජේසු බිළිදා රෙදි වලින් ඔතා ගවයන් කන ඔරුවක බාවා තිබූ බව.
    - ප්‍රථමයෙන් දේව දූත පණිවුඩය එඬේරුන් ලද බව.
    - එඬේරු දේව දූත පණිවුඩය පිළිගෙන ජේසු කුමරු නැමදීමට පැමිණි බව

(මිනිත්තු 15)

පියවර 2.

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න
- සෑම කණ්ඩායමකට ම ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 45 )

පියවර 3.

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.

    - සෙකරියස් පූජකතුමා තම දරුවා පිළිබඳව ප්‍රශංසා ගීතයක් ගායනා කළ බව
    - ස්නාවක ජොහාන්තුමාගේ මෙහෙසුරු දිවැසිවර සේවය පිළිබඳව සෙකරියස් පූජකතුමාගේ ප්‍රශංසා ගීතයේ සඳහන් බව
    - ජේසුස් වහන්සේගේ උපත බෙත්ලෙහෙමෙහි ගවමඩුවක සිදුවූ බව.

- ජේසුස් වහන්සේගේ උපත තුළින් දේව පොරොන්දුව ඉටු වූ බව.
- ජේසුස් වහන්සේගේ උපත සුභාරංචියක් වූ බව
- අප ද සුබසුන පිළි ගෙන නිසි ප්‍රතිචාර දැක්විය යුතු බව.

(මිනිත්තු 20)

**ගුණාත්මක යෙදවුම් :** ශුද්ධ බයිබලය - ශු. ලූක් 1: 57- 2: 20
ලී වලින් හෝ කාඩ් බෝඩ් වලින් තැනූ ගවලෙනක් හා පිදුරු
A4 කඩදාසි හා පැන්
ඇමුණුම: 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**
**ගවේෂණය සඳහා උපදෙස්**

**කණ්ඩායම 1:** ශු. ලූක් 1: 56-80 දක්වා බයිබල් කොටස අධ්‍යයනය කරන්න.

- සෙකරියස්ගේ ප්‍රශංසා ගීතය ඔබේ වචනයෙන් නිර්මාණාත්මක ව ඉදිරිපත් කරන්න.
- එළිසබෙත් හා සෙකරියස් දරුවාට නම තැබීමේ දී වූ විශේෂිත සිදුවීම පෙළ ගස්වන්න.

**කණ්ඩායම 2:** ශු. ලූක් 2:1-20 දක්වා බයිබල් කොටස අධ්‍යයනය කරන්න.

'ජේසු උපත දිළිඳුන්ට සුභාරංචියක් විය'
යන මාතෘකාව ඔස්සේ පුවත් පතකට ලිපියක් සකසන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

නිර්මාණාත්මක ගවලෙනක් සෑදීමට යොමු කරවන්න.

**නිපුණතාව 2.0** : ජේසුස් වහන්සේගේ පරිපූර්ණ ජීවිතය හා සේවය තුළින් දිවි මග ආලෝකවත් කර ගනියි.

**නිපුණතා මට්ටම 10.2.3** :කිතුනු දරුවකු ලෙස ශ්‍රී ලාංකේය සිරිත්වලට ගරු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02

**ඉගෙනුම් පල**

- ජේසුස් වහන්සේ වෙනුවෙන් තම මව්පියන් ඉටුකළ ජුදෙව් චාරිත්‍ර පිළිබඳ තොරතුරුගොනු කරයි.
- ජේසුස් වහන්සේ දරුවකු ලෙස දෙමාපියන්ට කීකරුව හැදී වැඩුණු බව පිළි ගනියි.
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඉදිරිපත් කරයි.
- ශ්‍රී ලාංකේය සිරිත් වලට ගරු කරයි.
- කිතුනුවන් ලෙස ශ්‍රී ලාංකේය අනන්‍යතාව ඇතිව ජීවත් වෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පියවර : 1.

- ඇමුණුම 2 පන්තියට බෙදා දී සියලු දෙනා එක්ව විරිදුව ගායනා කරන්න
- විරිදුවෙන් ඉදිරිපත් වන සිද්ධීන් පිළිබඳව සාකච්ඡාවක් මෙහෙය වන්න.
    - ජේසු කුමරුගේ මව් පියන් එතුමා වෙනුවෙන් ජුදෙව් චාරිත්‍ර ඉටු කළ බව.
    - සිමියොන් සහ අන්නා එතුමාගේ උපත පිළිබඳව බලාපොරොත්තුවෙන් සිටි බව
    - සිමියොන් එතුමා මෙසියස් වහන්සේ ලෙස පිළිගත් බව

(මිනිත්තු 15)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න
- සෑම කණ්ඩායමකට ම ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 45 )

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.
    - චර්මච්ඡේදනය ජුදෙව් පිළිවෙතක් බව
    - මව්පියන් ජේසුස් වහන්සේ වෙනුවෙන් චර්මච්ඡේදන පිළිවෙත ඉටු කළ ආකාරය.
    - කුළුඳුල් පිරිමි දරුවන් දෙවියන් වහන්සේට කැප කිරීම ජුදෙව් සිරිතක් බව.
    - සිමියොන් සහ අන්නා මෙසියස් වහන්සේගේ පැමිණීම අපේක්ෂා කළ බව
    - සිමියොන් ජේසුස් වහන්සේ ගැන අනාවැකි පළ කළ බව.
    - දොළොස් වියැති ජේසුස් වහන්සේ පාස්කු මංගල්‍යය සැමරීමට ගිය ආකාරය
    - අපගේ ජීවිත දෙවියන් වහන්සේට කැප කළ යුතු බව.
    - කිතුනුවන් ලෙස අගය කළ හැකි සිරිත් වලට ගරු කළ යුතු බව.

(මිනිත්තු 20)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය - ශු. ලූක් 2 : 21 - 52
A4 කඩදාසි හා පෑන්
ඇමුණුම: 1
ඇමුණුම: 2

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1

### ගවේෂණය සඳහා උපදෙස්

**කණ්ඩායම 1:** ශු. ලූක් 2: 21- 52 දක්වා බයිබල් කොටස අධ්‍යයනය කරන්න.
'ජේසුස් වහන්සේ වෙනුවෙන් තම දෙමව්පියන් ඉටු කළ ජුදෙව් චාරිත්‍ර'
පිළිබඳ කථාවක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය තොරතුරු සටහන් කර ගන්න.
කථාව පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**කණ්ඩායම 2.** ශු. ලූක් 2:39- 52 දක්වා බයිබල් කොටස අධ්‍යයනය කරන්න.
'දොළොස් වියෙහි වූ ජේසු කුමරා පියාණන් වහන්සේ පිළිබඳ ගැඹුරු වැටහීමකින් ක්‍රියා කළ සේක.'
කථාවක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය තොරතුරු සටහන් කර ගන්න..
කථාව පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

## ඇමුණුම 2

විරිඳුව

ජුදයේ සිරිතක් ලෙස - බිළිඳුන් දෙවිඳුන් වෙත
පුද කරනට ගෙන යනවා දේව මාලිගාවට

අටවෙනි දින දරුවට - නම තබනව මව් පිය
ජේසුස් යන නාමය දුනි දේව දූත අණ ලෙස

දින හතළිහ පිරුණම - කැප කරනව දෙවිඳුට
ඒ විලසට ගෙන ආවා ජේසු බිළිඳු පුදනට

තම තමාගෙ තරමට කොබෙයි දෙදෙන පුදනට
දේව මාළිගයට ගියේ ජුදයේ සිරිතක් ලෙස

සිමියොන් සහ අන්නා නම් - බැතිමත් දෙපලක් ලෙසින්
මෙසියස් ලොව වඩිනා තෙක් බලා සිටියෙ හද බැතින්

ලොව ගැළවුම් කරු තුමා - සිමියොන් දෑතට ගෙනා
එතුමාගේ සේවය ගැන පවසයි හද බැතියෙනා

**ගෙදර පරිසරයෙන්**

එදිනෙදා තම තමාගේ කාර්යයන් ඉටු කර ගැනීමට යොමු කරවන්න.

**නිපුණතාව 2.4** : ජේසුස් වහන්සේගේ පරිපූර්ණ ජීවිතය හා සේවය තුළින් දිවි මග ආලෝකවත් කර ගනියි.

**නිපුණතා මට්ටම 10.2.4** :ස්නාවක ජොහාන්ගේ මනස්ථාපනයේ පණිවුඩය ජීවිතය ට අදාළ කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 03

**ඉගෙනුම් පල**

- ස්නාවක ජොහාන්තුමා ජනතාවට කළ ඉගැන්වීම් පිළිබඳ කරුණු ගොනු කරයි
- යහපත ඉටු කිරීමෙන් සමාජය ගොඩනැගිය හැකි බව පිළි ගනියි
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඉදිරිපත් කරයි.
- තම ජීවිත පැවැත්මෙන් අන් අයට ආදර්ශයක් වෙයි.
- අප සතු දේවල් බෙදා ගත යුතු බව පිළි ගනියි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පියවර : 1.

- සමාජ අසාධාරණය නිසා පීඩා විඳින ජනතාව පිළිබඳ සඳහන් පුවත් පත් ලිපි 3ක් හා ලූක් 3:7-14 කොටස සිසු දරුවන් 4 දෙනෙකුට ලබා දී පන්තියට ඉදිරිපත් කරවන්න.
- ඉහත කරුණු පිළිබඳව සාකච්ඡාවක් මෙහෙය වන්න.
  - ස්නාවක ජොහාන් තුමා ජුදා සමාජයට අවශ්‍ය මනස්ථාපනයේ පණිවුඩය ලබා දුන් බව.
  - වත්මන් සමාජයේ අයුක්තිය හා අසාධාරණය රජකරන බව
  - වරද දුටු තැන ඊට එරෙහි ව ක්‍රියා කළ යුතු බව.

(මිනිත්තු 20)

පියවර 2

- ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 45)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.
  - ස්නාවක ජොහාන්තුමා සෙනඟට බොහෝ අනුශාසනා ලබා දුන් බව
  - ජනතා සිත් සූදානම් කරමින් මනස්ථාපනයේ බෞතිස්මය ලබා දුන් බව.
  - සමිඳුන්ගේ මග පිළියෙළ කළ බව.
  - ජේසුස් වහන්සේගේ බලවන්ත කම පිළිබඳව ස්නාවක ජොහාන්තුමා සෙනඟට ප්‍රකාශ කළ බව.
  - අපද මනස්ථාපනය විය යුතු බව
  - යහපත ඉටු කරමින් සමාජය ගොඩ නැඟීමට ක්‍රියා කළ යුතු බව.

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම් :** ශුද්ධ බයිබලය - ශු. ලූක් 3 ៖ 1 - 20
පුවත් පත් ලිපි (සමාජ අසාධාරණ සිදුවීම් පිළිබඳ)
A4 කඩදාසි හා පෑන්
ඇමුණුම: 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**
**ගවේෂණය සඳහා උපදෙස්**

**ශු. ලූක් 3: 1 - 20** දක්වා බයිබල් කොටස අධ්‍යයනය කරන්න.

- ස්නාවක ජොහාන්තුමා බෞතිස්ම ස්නාපනය ලබා දෙන අවස්ථාවේදී ජනතාවට ලබා දුන් පණිවුඩය නිර්මාණාත්මක ව ඉදිරිපත් කරන්න. (ලිපි/නිසඳැස්/විරිඳු/නාට්‍ය)

- ස්නාවක ජොහාන් තුමාගේ පණිවුඩය වර්තමාන සමාජයේ සිටින
  සාමාන්‍ය ජනතාවට
  නිළධාරීන්ට
  දේශපාලනඥයින්ට දිය හැකි ආකාරය ඔබේ වචනයෙන් නිර්මාණාත්මක ව ඉදිරිපත් කරන්න.

  තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

සැම විටම බෙදා ගැනීමේ පුරුද්ද ඇති කරවන්න.

**නිපුණතාව 2.0** : ජේසුස් වහන්සේගේ පරිපූර්ණ ජීවිතය හා සේවය තුළින් දිවි මග ආලෝකවත් කර ගනියි.

**නිපුණතා මට්ටම 10.2.5 :** ජේසුස් වහන්සේගේ සේවයේ පරමාර්ථ ආදර්ශයට ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 01

**ඉගෙනුම් පල**

- නාසරෙත් හි ජේසුස් වහන්සේ කළ දේශනය පිළිබඳව කරුණු ගොනු කරයි.
- ජේසුස් වහන්සේගේ සේවයේ අරමුණ දේව රාජ්‍යය ප්‍රකාශ කිරීම බව විශ්වාස කරයි.
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඉදිරිපත් කරයි.
- විවිධ සමාජ අභියෝගතා ඉදිරියේ නොසැලී ක්‍රියා කරයි.
- සාමූහික ව අභියෝග ජය ගනියි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පියවර : 1.

- යෙසායා 61: 1-2 ලියන ලද පුවරුවක් ප්‍රදර්ශනය කොට පහත කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාවක් මෙහෙය වන්න.
    - ජේසුස් වහන්සේ නාසරෙත් ධර්ම ශාලාවේ දේශනා කළ බව.
    - ජේසුස් වහන්සේ තම සේවයේ පරමාර්ථ පිළිබඳ පැහැදිලි කළ බව.
    - ජේසුස් වහන්සේගේ සේවය තුළින් දිළිඳුන්ට සහනයක් සැලසෙන බව.

(මිනිත්තු 8)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- සැම කණ්ඩායමකට ම ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 20 )

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.
    - දිවැසිවර යෙසායා, ජේසුස් වහන්සේගේ සේවය පිළිබඳ දිවැස් වැකි ප්‍රකාශ කර ඇති බව - ශු. ලූක් 4: 18-19
    - දේව රාජ්‍යය ප්‍රකාශ කිරීම උන්වහන්සේගේ සේවයේ අරමුණ වූ බව
    - ජේසුස් වහන්සේ පීඩනයෙන් හා අසහනයෙන් පෙළෙන අයට සහනයක් වූ බව
    - විවිධ ප්‍රතිචාර ඉදිරියේ ජේසුස් වහන්සේ නොසැලී සිටිය බව - ශු. ලූක් 4 : 20-24

- දෙවියන් වහන්සේ අන්‍ය ජාතීන්ට ද කරුණාව දැක්වූ බව ජේසුස් වහන්සේගේ දේශනය තුළින් ප්‍රකාශ වූ අයුරු. - ශු. ලූක් 4: 25-30
- දෙවියන් වහන්සේගේ කරුණාව අපට ද හිමි වන බව
- සේවයේ යෙදෙන විට ඇති වන විවිධ ප්‍රතිචාර ඉදිරියේ නොසැලී ක්‍රියා කළ යුතු බව.

(මිනිත්තු 12)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය - ශු. ලූක් 3:23, 4:14-30
යෙසායා 61: 1-2 ලියන ලද පුවරුව
A4 කඩදාසි හා පෑන්
ඇමුණුම: 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**
**ගවේෂණය සඳහා උපදෙස්**

**කණ්ඩායම 1:** ශු. ලූක් 3: 23, 4: 14 - 19 දක්වා බයිබල් කොටස අධ්‍යයනය කරන්න. යෙසායාගේ අනාවැකියට අනුව ජේසුස් වහන්සේගේ සේවය ඉටු වූ ආකාරය පිළිබඳ කරුණු පෙළ ගස්වන්න.

**කණ්ඩායම 2:** ශු. ලූක් 3: 23, 4: 14 - 30 දක්වා බයිබල් කොටස අධ්‍යයනය කරන්න. නාසරෙත් හි දේශනයේ දී එහි සිටි ජනතාව දැක් වූ ප්‍රතිචාර පිළිබඳ ව හා ජේසුස් වහන්සේ ක්‍රියා කළ ආකාරය පිළිබඳ ව නාට්‍ය පිටපතක් සකසන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

දේවස්ථානයේ සමිති සමාගම් වලට දරුවන් යොමු කරවන්න

**නිපුණතාව 2.0** : ජේසුස් වහන්සේගේ පරිපූර්ණ ජීවිතය හා සේවය තුළින් දිවි මග ආලෝකවත් කර ගනියි.

**නිපුණතා මට්ටම 10.2.6** :දේව කැඳවීමට නිසි ප්‍රතිචාර දක්වයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02

**ඉගෙනුම් පල**

- ජේසුස් වහන්සේගේ සේවයට ගෝලයින් කැඳවීම පිළිබඳව කරුණු ගොනු කරයි.
- ජේසුස් වහන්සේගේ සේවයේ පංගුකාරයන් විය යුතු බව පිළිගනියි.
- නිර්මාණාත්මක වාර්තාවක් ඉදිරිපත් කරයි.
- ජේසුස් වහන්සේගේ කැඳවීමට නිසි ප්‍රතිචාර දක්වයි.
- එකමුතු ව සේවය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පියවර : .1.

- ඇමුණුම 2 ලබාදී ගීතිකාව ගායනා කිරීමට සලස්වන්න.
- පහත කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාවක් මෙහෙය වන්න.
    - ගෝලයෝ ජේසුස් වහන්සේගේ හඬට කීකරු වූ බව.
    - දේවරාජ්‍යයේ සේවයට අපව ද කැඳවන බව.
    - ජේසුස් වහන්සේගේ හඬට කීකරුව සේවයට නැඹුරු විය යුතු බව.

(මිනිත්තු 15)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 40 )

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.
    - ජේසුස් වහන්සේ මුල් ගෝලයන් කැඳවූ ආකාරය. - ශු. ලූක් 5: 1-11
    - ජේසුස් වහන්සේ තම සේවයට විශේෂ ශ්‍රාවකයින් පත් කර ගත් ආකාරය. ශු. ලූක් 6: 12-16
    - ජේසුස් වහන්සේ තරාතිරම් නොබලා සේවයට කැඳවූ බව.
    - ජේසුස් වහන්සේ අප ද දේව රාජ්‍යයේ කොටස් කරුවන් වීමට කැඳවන බව.
    - එම කැඳවීමට නිසි ප්‍රතිචාර දැක් විය යුතු බව.
    - ඕනෑම අවස්ථාවක දී දේව රාජ්‍යයේ සේවයට කැඳවීමක් ලැබිය හැකි බව.

(මිනිත්තු 25)

**ගුණාත්මක යෙදවුම් :** ශුද්ධ බයිබලය- ශු. ලූක් 5:1-11, 6:12-16, 9:1-6, 10:1-12, 17, 20 පද
A4 කඩදාසි හා පෑන්
ඇමුණුම: 1
ඇමුණුම: 2

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1
## ගවේෂණය සඳහා උපදෙස්

**කණ්ඩායම 1:** ශු. ලූක් 5:1-11, 6:12-16 දක්වා බයිබල් කොටස අධ්‍යයනය කරන්න.

- මුල් ගෝලයන් කැඳවීම පිළිබඳ නිර්මාණාත්මක වාර්තාවක් ඉදිරිපත් කරන්න.
- ජේසුස් වහන්සේ තෝරාගත් ශ්‍රාවකයන් පිරිසගේ නම් ඇතුලත් කරමින් කවියක් නිර්මාණය කරන්න.

**කණ්ඩායම 2:** ශු. ලූක් 9:1-6, 10:1-12, 17, 20 දක්වා බයිබල් කොටස අධ්‍යයනය කරන්න.

- ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයන් 12 දෙනා පිටත් කර යැවීමේ දී ඔවුන්ට දුන් උපදෙස් හා සැත්තෑ දෙනා පිටත් කර යැවීමේ දී ඔවුන්ට දුන් උපදෙස් වගු ගත කරන්න.
- සැත්තෑ දෙනා කැඳවීමේ දී සේවයේ භාරදූරබව පෙන්වීමට යොදා ගත් උදාහරණ ලියන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

## ඇමුණුම 2

ජේසුස් සමිනේ මම එම් මෙදිනේ - කැඳවන සැම තැන යන ලෙසිනේ
ගෝලයෝ ගියෝ තොසින් ඒ බලේ ලැබූ සෙදින්
සේවයේ යෙදෙන්න අවසර දෙන්න ඒ ලෙසින්

ජේසුස් සමිනේ මම එම් මෙදිනේ - දුන් ආසිරි ගෙන එම් තුටු සිතිනේ
සේවයේ යෙදී සිටිම් ඒ උතුම් දෙව් ස්වාමිගේ
නැත්තේ කිසි සැනසුම නො ලැබේ නම් ඒ සැපේ

ජේසුස් සමිනේ මම එම් මෙදිනේ - පුදනට පාමුල තලෙන්ත මගේ
සැමදේ මැදින් ජයෙන් යන්නෙමී බෙලෙන් ඔබේ
දුක් විපත් ඇති දණන් සොයා යම් මේ මාර්ගයේ

ජේසුස් සමිනේ මම එම් මෙදිනේ - ඔබ අණ ලෙස සත කැඳවන සේ
දේව ආත්මයෙන් දැවී - ලෝක ආසා යයි ගෙවී
යන්නෙම් ඔබ පස්සේ කුරුසිය ගෙන තොස් වෙවී

ජේසුස් සමිනේ මම එම් මෙදිනේ - දේවාසිරින් මෙම ලොව සරසන සේ
මා නොවේ ඔබේ පෙමයි මේ ලොවේ උතුම් එයයි
ප්‍රේමයේ ඒ මහිමය විශ්වයේ බැබලේවා.

ක්‍රිස්තියානි ගීතිකා පොතේ 392

**ගෙදර පරිසරයෙන්**

දේවස්ථානයේ සමිති සමාගම් වලට දරුවන් යොමු කරවන්න

**නිපුණතාව 2.0 :** ජේසුස් වහන්සේගේ පරිපූර්ණ ජීවිතය හා සේවය තුළින් දිවි මග ආලෝකවත් කර ගනියි.

**නිපුණතා මට්ටම 10.2.7 :** තරාතිරම් නොබලා සැම දෙනා පිළි ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 03

**ඉගෙනුම් පල**

- ජේසුස් වහන්සේගේ කාලයේ ජීවත් වූ කාන්තාවන් හා දරුවන් පිළිබඳ කරුණු ගොනු කරයි.
- ජේසුස් වහන්සේ කාන්තාවන් ට හා දරුවන් ට වටිනාකමක් දුන් බව පිළි ගනියි. .
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඉදිරිපත් කරයි..
- තරාතිරම් නොබලා කටයුතු කරයි.
- සියල්ලන් සමග ප්‍රේමයෙන් දිවි ගෙවයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පියවර : 1.

- පන්තියට ගෙනෙන ලද පුවත් පත් ලිපි කියවීමට සලස්වා ඒ පිළිබඳ අදහස් විමසන්න.
- පහත කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාවක් මෙහෙය වන්න.
    - දරුවන් හා කාන්තාවන් විවිධ අතවර වලට ලක්වන බව
    - සමාජයේ ජීවත් වන දරුවන් විවිධ අපචාර වලට යොමුවන බව
    - කාන්තාවන් සමාජය තුළ වගකීම් රැසකට හිමිකම් කියන බව

(මිනිත්තු 20)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 60 )

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.
    - ජේසුස් වහන්සේ පවුල පිළිබඳව නව සංකල්පයක් ගොඩනැංවූ බව
    - කාන්තාවන් අගය කරමින් ඔවුන්ගේ ජීවිතවලට වටිනාකමක් දුන් බව
    - දේව රාජ්‍යයේ උරුම කර ගැනීමට දරුවන් මෙන් නිහතමානී විය යුතු බව.
    - ප්‍රතික්ෂේප වූවන් සමාජයට පිළි ගත යුතු බව
    - දේව රාජ්‍යයේ වටිනාකම් තුළ කිතුනුවා ක්‍රියා කළ යුතු බව.
    - තරාතිරම් නොබලා සැම දෙනා පිළි ගත යුතු බව

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය- ශු. ලූක් 8: 1-3, 19-21, 43-48, 10: 38-42, 7: 36-50, 13: 10-17, ශු. ලූක් 19: 1-10, 5: 12-16, 9: 46-48, 18: 15-17, 17: 1-2
ළමා අපචාර හා කාන්තා හිංසනයන් පිළිබඳ සඳහන් වන පුවත් පත් ලිපි
A4 කඩදාසි හා පෑන්
ඇමුණුම: 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**ගවේෂණය සඳහා උපදෙස්**

: පවුල - ශු. ලූක් 8: 19-21,
කාන්තාවන් - ශු. ලූක් 8: 1-3, 10: 38-42, 7: 36-50, 8: 43-48, 13: 10-17,
ප්‍රතික්ෂේප වූවන් - ශු ලූක් 19: 1-10, 5: 12-16,
දරුවන් - ශු ලූක් 9: 46-48, 18: 15-17, 17: 1-2
ඔබට ලැබී ඇති බයිබල් පාඨය මනාව අධ්‍යයනය කරන්න.

**1 කණ්ඩායම -**

- පවුල හා කාන්තාවන් පිළිබඳ සඳහන් බයිබල් කොටස් අධ්‍යයනය කරන්න.
- ඔවුන් මුහුණ දුන් ගැටළු හා ජේසුස් වහන්සේ ලබා දුන් විසඳුම් පිළිබඳ ව තොරතුරු වගු ගත කරන්න.
- අද සමාජයේ පවුල් හා කාන්තාවන් මුහුණ දෙන ගැටළු හා කිතුනුවන් ලෙස ඔවුන් සම්බන්ධයෙන් ක්‍රියා කළ හැකි ආකාරය පිළිබඳව පුවත් පතකට ලිපියක් ලියන්න.

**2 කණ්ඩායම -**

- දරුවන් හා ප්‍රතික්ෂේප වූවන් පිළිබඳ ව සඳහන් බයිබල් කොටස් අධ්‍යයනය කරන්න.
- ඔවුන් මුහුණ දුන් ගැටළු හා ජේසුස් වහන්සේ ලබා දුන් විසඳුම් පිළිබඳව තොරතුරු වගු ගත කරන්න.
- අද සමාජයේ දරුවන් හා ප්‍රතික්ෂේප වූවන් මුහුණ දෙන ගැටළු හා කිතුනුවන් ලෙස ඔවුන් සම්බන්ධයෙන් ක්‍රියා කළ හැකි ආකාරය පිළිබඳ ව පුවත් පතකට ලිපියක් ලියන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

සැමට එක හා සමානව සැලකීමට දරුවන් යොමු කරන්න.

**නිපුණතාව 2.0** : ජේසුස් වහන්සේගේ පරිපූර්ණ ජීවිතය හා සේවය තුළින් දිවි මග ආලෝකවත් කර ගනියි.

**නිපුණතා මට්ටම 10.2.8 :** සමාජ ව්‍යුහය පිළිබඳ ධනාත්මක සංවාද හා පලදායි විවේචන මගින් ජීවිතය යහ මගට යොමු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 03

**ඉගෙනුම් පල**

- ජේසුස් වහන්සේට ජුදෙව් සමාජයේ ඇතිවූ අභියෝග පිළිබඳව කරුණු ගොනු කරයි.
- ජේසුස් වහන්සේ චෝදනාවලට ධනාත්මක ප්‍රතිචාර දැක්වූ බව පිළිගනියි.
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි.
- විවේචන සඳහා ධනාත්මක ප්‍රතිචාර දක්වයි.
- නිවැරදි දැක්මකින් සාමූහික ව දිවි ගෙවයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පියවර : 1.

- 'විවේචනය කිරීම' යන වචනය හුණු පුවරුවේ ලියා ඒ පිළිබඳ අදහස් විමසන්න.
- පහත කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාවක් මෙහෙය වන්න.
    - අප සමාජයේ විවිධ මත දරන අය සිටින බව
    - ඔවුන් තමන් හරි යයි සිතා අනෙක් අය විවේචනය කරන බව
    - විවේචන තුළින් යහ මගට අවතීර්ණ විය හැකි බව

(මිනිත්තු 20)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 60 )

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.
    - පරිසිවරු හා විනයධරයන් ක්‍රියා කළ ආකාරය -<br>පරිසිවරු- ශු. ලූක් 5: 17-39, 6: 1-5, 11: 37-44, 12: 1-3, 14: 1-6, 16: 14-17, 17: 20-21<br>විනයධරයෝ - ශු. ලූක් 6: 6-11, 11: 45-54, 20: 45-47
    - ඔවුන් ජේසුස් වහන්සේගේ ක්‍රියාවන්ට එරෙහිව චෝදනා නැගූ බව
    - ජේසුස් වහන්සේ ඒවාට ප්‍රතිචාර දැක්වූ ආකාරය.
    - ජේසුස් වහන්සේ යහපත් ආකල්ප තුළින් ඔවුන්ට නිවැරදි මග පෙන්වූ බව
    - විවේචනය වීම හා විවේචනය කිරීම අද සමාජය තුළ සිදුවන බව.
    - යහපත් ආකල්ප හා සංවාද තුළින් වෙනසක් ඇති කළ හැකි බව

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය- ශු. ලූක් 5: 17-39, 6: 1-5, 11: 37-44, 12: 1-3, 14: 1-6, 16: 14-17,
ශු. ලූක් 17: 20-21, 6: 6-11, 11: 45-54, 20: 45-47
A4 කඩදාසි හා පෑන්
ඇමුණුම: 1,

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1
## ගවේෂණය සඳහා උපදෙස්

**කණ්ඩායම 1:** ශු. ලූක් 5: 17-39, 6: 1-5, 11: 37-44, 12: 1-3, 14: 1-6, 16: 14-17, 17: 20-21 දක්වා බයිබල් කොටස අධ්‍යයනය කරන්න. ඒ ඇසුරෙන්,

ජේසුස් වහන්සේ හා පරිසිවරු අතර ඇති වූ ගැටුම හා ඊට ජේසුස් වහන්සේ ලබා දුන් පිළිතුරු වගු ගත කරන්න

**කණ්ඩායම 2:** ශු. ලූක් 6: 6-11, 11: 45-54, 20: 45-47 දක්වා බයිබල් කොටස අධ්‍යයනය කරන්න. ඒ ඇසුරෙන් ,

ජේසුස් වහන්සේ හා විනයධරයන් අතර ඇති වූ ගැටුම හා ඊට ජේසුස් වහන්සේ ලබා දුන් පිළිතුරු වගු ගත කරන්න

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

විවේචනය කිරීමෙන් වළකින්න.

**නිපුණතාව 2.0** : ජේසුස් වහන්සේගේ පරිපූර්ණ ජීවිතය හා සේවය තුළින් දිවි මග ආලෝකවත් කර ගනියි.

**නිපුණතා මට්ටම 10.2.9** :අභියෝග මැද සේවය කිරීමට දිරිය ලබයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02

**ඉගෙනුම් පල**

- සද්දුසිවරුන් පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- ජේසුස් වහන්සේ එකළ සමාජයේ තිබූ සෘණාත්මක ආකල්ප වෙනස් කළ බව පිළි ගනියි.
- වාර්තාවන් නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි
- යහපත් ආකල්ප වර්ධනය කර ගනියි.
- අභියෝග මැද සැම දෙන සමග සහයෝගයෙන් ක්‍රියා කරයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පියවර : 1.

- ඇමුණුම 2 පෙර සූදානමකින් යුතුව රඟ දැක්වීමට සලස්වන්න.
- පහත කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.
    - නායක පූජකයන් ජේසුස් වහන්සේ ගේ අධිකාරී බලය පිළිබඳ ව ප්‍රශ්න කළ බව
    - ජේසුස් වහන්සේ ප්‍රශ්නවලට පිළිතුරු දුන් බව
    - අපට ද විවිධ ප්‍රශ්නවලට මුහුණ දීමට සිදු වන බව

(මිනිත්තු 16)

පියවර 2

- ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 40)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.
    - සද්දුසිවරු යනු කව්ද? - ආගමික කණ්ඩායමක් බව
      නායක පූජකයන් ඔවුන් අතරින් පත්කරන බව
      සැඩොක් නම් පෙළපතින් පැවත එන බව.
    - සද්දුසිවරු තුළ විවිධ විශ්වාස පැවති බව.
    - සද්දුසිවරු ජේසුස් වහන්සේට එල්ල කළ අභියෝග
      අධිකාරී බලය - ලූක් 20 1-18
      ආදායම් බදු ගෙවීම ලූක් 20:9-26
      පුනරුජ්ජීවනය ලූක් 20:26-40
    - ජේසුස් වහන්සේ ඔවුන්ගේ ආකල්ප වෙනස් කිරීමට උත්සාහ දැරූ ආකාරය
    - අපට සමාජයේ අභියෝග එල්ල වන බව
    - අභියෝග ජය ගනිමින් මෙහෙවරේ යෙදිය යුතු බව..

(මිනිත්තු 24)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය- ශු. ලූක් 20: 1-40
A4 කඩදාසි හා පෑන්
ඇමුණුම: 1,
ඇමුණුම: 2

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1
## ගවේෂණය සඳහා උපදෙස්

- ශු. ලූක් 20: 1-40 දක්වා බයිබල් කොටස අධ්‍යයනය කරන්න. ඒ ඇසුරෙන් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
  1 සද්දුසිවරු ජේසුස් වහන්සේ වෙත ඉදිරිපත් කළ අභියෝග මොනවාද?
  2 ජේසුස් වහන්සේට එවැනි අභියෝග එල්ල කලේ කුමක් සඳහාද?
  3 ජේසුස් වහන්සේ එවැනි අභියෝග ජයගත්තේ කෙසේද?
  4 අද සමාජයේ සිටින එවැනි කණ්ඩායම් නම් කරන්න.
  5 ඔබට ඔවුන්ගෙන් එල්ලවන අභියෝග මොනවාද?
  6 අප ඒවාට මුහුණ දෙන්නේ කෙසේද?

- අභියෝග ජය ගැනීමට දෙවි වදන අනුව ක්‍රියා කරමු.
  යන මැයෙන් පුවත් පතකට ලිපියක් රචනා කරන්න.
  තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

## ඇමුණුම .2

| | |
|---|---|
| පූජකයා - | අන්න ජේසුස් දේශනා කරනවා. අපි ගිහින් අපේ ප්‍රශ්නේ අහලා බලමු. |
| තවත් පූජකයෙක්- | ඔව්. ඔව්, දැන් ඒකට කාලය හොඳයි |
| නායක පූජකයා - | කාගේ බලයකින් ද ඔබ මේ දේවල් කරන්නේ? කවුද ඔබට මේ බලය දුන්නේ? |
| ජේසුස් වහන්සේ - | මමත් ඔබෙන් ප්‍රශ්නයක් අසනවා. ඒකට පිළිතුරක් දෙන්න. ජොහාන් බෞතීස්ම කිරීමේ බලය ලැබුවේ දෙවියන් වහන්සේගෙන් ද නැතහොත් මනුෂ්‍යාගෙන් ද ? |
| නායක පූජකයා - | දැන් අපි මොකද කියන්නේ. දෙවියන් වහන්සේ ගෙන් කිව්වොත් එසේ නම් ඇයි අදහා ගත්තේ නැත්තේ කියා අහයි. මනුෂ්‍යයා ගෙන් යැයි කීවොත් අපට මිනිසුන් ගල් ගහයි. අපි මොකද කියන්නේ? |
| පූජකයෙක් - | අපි උත්තරයක් නොදී ඉමු. දන්නේ නැහැ කියමු. |
| නායක පූජක - | අපි ඒකට පිළිතුරක් දන්නේ නැහැ. |
| ජේසුස් වහන්සේ - | එසේ නම් මගේ අධිකාරී බලය ගැනත් මම කිසිවක් ඔබට කියන්නේ නැහැ |

**ගෙදර පරිසරයෙන්**

වරද දුටු තැන පෙන්වා දෙන්න.

**නිපුණතාව 2.0** : ජේසුස් වහන්සේගේ පරිපූර්ණ ජීවිතය හා සේවය තුළින් දිවි මග ආලෝකවත් කර ගනියි.

**නිපුණතා මට්ටම 10.2.10:** සමාජ අභියෝග මැද සහෝදරත්වයෙන් හා සහභාගිත්වයෙන් ක්‍රියා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 03

**ඉගෙනුම් පල**

- දුක් ප්‍රාප්තියට පෙර වැදගත් සිදුවීම් පෙළ ගස්වයි.
- ජේසුස් වහන්සේ රජකු ලෙස පිළි ගනියි.
- ක්‍රියාකාරකම් නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි
- ජේසුස් වහන්සේගේ ශරීරයට හා රුධිරය අප වෙනුවෙන් පූජා කල බව විශ්වාස කරයි.
- ජේසුස් වහන්සේගේ ජීවිත ආදර්ශයෙන් ක්‍රියා කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පියවර : .1.

- තල් අතු ඉරුදිනට නියමිත ගීතිකාවක් ගායනා කරමින් පන්තියට පිවිසීමට දරුවන්ට ඉඩ සලසන්න.
- ගෙනෙන ලද පින්තූරය පන්තියට ඉදිරිපත් කරන්න.
- සිසු ක්‍රියාකාරකම් හා පින්තූරය ඇසුරෙන් සාකච්ඡාවට පිවිසෙන්න
    - ජෙරුසලම් දේවමාලිගාව ජුදෙව්වන්ගේ ආගමික මධ්‍යස්ථානය බව.
    - හෝසන්නා හඬ මැද ජේසුස් වහන්සේ ජෙරුසලම් දේව මාලිගාවට වැඩිය බව
    - දේව මාලිගාව තුළ වෙළඳාම් කිරීම ජේසුස් වහන්සේ හෙළා දුටු බව.

(මිනිත්තු 20)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 60 )

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියළු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.
    - රජකු ලෙස ජේසුස් වහන්සේ ජෙරුසලම් දේව මාලිගාවට ගියේ කොටළුවකු පිට බව
    - ජේසුස් වහන්සේ දේවමාලිගාව පවිත්‍ර කළ බව.
    - දේව මාලිගාව යාච්ඤාවේ ගෘහයක් බව.
    - ජේසුස් වහන්සේ තම ගෝලයන් සමග පාස්කුව සැමරූ බව.
    - ජූදස්ගේ කුමන්ත්‍රණය - ශු. ලූක් 22:21-23
    - උන්වහන්සේ අළුත් ගිවිසුමක් ස්ථාපිත කළ බව
    - කිතුනු අප ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරයෙන් හා රුධිරයෙන් පෝෂණය වන බව.
    - අප එම කෘත්‍යය සැදැහැ සිතින් ඉටු කළ යුතු බව.

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම් :** ශුද්ධ බයිබලය- ශු. ලූක් 19:28-48, 22: 1-23
ජේසුස් වහන්සේ ජෙරුසලම් දේවමාලිගාවට පිවිසීමේ පින්තූරය
A4 කඩදාසි හා පෑන්
ඇමුණුම: 1,

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**
**ගවේෂණය සඳහා උපදෙස්**

**1 කණ්ඩායම**

- ශු. ලූක් 19: 28-48 දක්වා බයිබල් කොටස අධ්‍යයනය කරන්න.
- ජේසුස් වහන්සේ රජෙකු ලෙස ජෙරුසලම් දේව මාලිගාවට පිවිසීමේ සිද්ධිය නිර්මාණාත්මක ව ඉදිරිපත් කරන්න. (කවි/ගීත/විරිදු/නිසඳැස්)

**2 කණ්ඩායම**

- ශු. ලූක් 22: 1-23 දක්වා බයිබල් කොටස අධ්‍යයනය කරන්න.
- ජේසුස් වහන්සේගේ අවසාන රාත්‍රී භෝජනය පිළිබඳ කරුණු ගොනු කරන්න.
- එම කරුණු ඇසුරෙන් කථාවක් ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

චතාරික/උපවාස කාලය තුළ දුක් ප්‍රාප්තිය පිළිබඳව මෙනෙහි කිරීමට යොමු කරවන්න

**නිපුණතාව 2.0** : ජේසුස් වහන්සේගේ පරිපූර්ණ ජීවිතය හා සේවය තුළින් දිවි මග ආලෝකවත් කර ගනියි.

**නිපුණතා මට්ටම 10.2.11 :** යාච්ඤාව පෙරදැරි ව දේව කැමැත්ත ඉටු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 01

**ඉගෙනුම් පල**

- ඔලීව කන්දේ සිදු වූ සිදුවීම් පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- දේව කැමැත්තට ජේසුස් වහන්සේ අවනත වූ බව පිළි ගනියි.
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඉදිරිපත් කරයි
- නිරන්තරයෙන් දේව කැමැත්තට අවනත වෙයි.
- දේව කැමැත්ත අනුව සාමූහික ව දිවි ගෙවයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පියවර : 1.

- පන්තියට ගෙන එන ලද පින්තූරය සිසුන් ඉදිරියේ ප්‍රදර්ශනය කරන්න..
- පහත කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාවක් මෙහෙය වන්න.
    - ඔලීව කන්දේ දී ජේසුස් වහන්සේ යාච්ඤා කළ බව.
    - නිරතුරුව ම දේව කැමැත්ත සෙවිය යුතු බව.
    - දේව කැමැත්තට අවනත වීම තුළ අපගේ ජීවිත ආලෝකවත් කරගත හැකි බව.
    - දේව කැමැත්ත ඉටු කිරීමෙන් අපගේ ජීවිතයට නව පන්නරයක් ලැබෙන බව

(මිනිත්තු 8)

පියවර 2

- ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 20)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.
    - ජේසුස් වහන්සේ තම කැමැත්තට නොව දේව කැමැත්තට අවනත වූ බව
    - අප ජීවිත ගමනේ දී දේව කැමැත්ත සෙවිය යුතු බව.
    - දේව කැමැත්ත ඉටු කිරීම තුළ යහපත් සමාජයක් ගොඩනැගීමට දායක විය හැකි බව.
    - යාච්ඤාවේ දී අපගේ කැමැත්තට නොව දේව කැමැත්තට එකඟ විය යුතු බව.

(මිනිත්තු 12)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය- ශු. ලූක් 22:39-53
ගෙත්සෙමන උයන දැක්වෙන පින්තූරයක්
A4 කඩදාසි හා පෑන්
ඇමුණුම: 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**
**ගවේෂණය සඳහා උපදෙස්**

- ශු. ලූක් 22: 39-53 දක්වා බයිබල් කොටස අධ්‍යයනය කරන්න.
- එය මෙනෙහි කරන්න.
- ඔලීව කන්දේ සිදුවීම පිළිබඳව විරිදුවක්/ගීතයක් /නිසඳැසක් නිර්මාණය කරන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

දේව කැමැත්තට අනුකූල ව තීරණ ගැනීමට යොමු කරවන්න.

**නිපුණතාව 2.0** : ජේසුස් වහන්සේ ගේ පරිපූර්ණ ජීවිතය හා සේවය තුළින් දිවි මග ආලෝකවත් කර ගනියි.

**නිපුණතා මට්ටම 10.2.12 :** අසාධාරණත්වය ඉදිරියේ නොසැලී දිවි ගෙවයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 03

**ඉගෙනුම් පල**

- ජේසුස් වහන්සේගේ විනිශ්චය අවස්ථා පිළිබඳ කරුණු ගොනු කරයි.
- ජේසුස් වහන්සේ අප වෙනුවෙන් කුරුසිපත් වූ බව පිළිගනියි.
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඉදිරිපත් කරයි
- පෞද්ගලික වාසි හමුවේ වැරදි දේ නොකිරීමට පෙළඹෙයි.
- සාධාරණ ලෙස ජීවත් වීමට වෙර දරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පියවර : 1.

- පන්තියට ගෙන එන ලද පින්තූරය සිසුන් ඉදිරියේ ප්‍රදර්ශනය කරන්න..
- පහත කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාවක් මෙහෙය වන්න.
    - ඕනෑම රටක නීති පද්ධතියක් ඇති බව.
    - වැරදි කරන අයට දඬුවම් ලැබෙන බව.
    - ශ්‍රේෂ්ඨාධිකරණය නීතිය ක්‍රියාත්මක කරන ආයතනයක් බව.
    - නිදොස් අය පවා වැරදිකරුවන් ලෙස නම් කරන බව.
    - ප්‍රබල අයගේ බලපෑම් මත අසාධාරණ විනිශ්චයන් ලැබෙන බව.

(මිනිත්තු20)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 60 )

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.
    - ජුදා සමාජයේ නීති පද්ධතියක් තිබූ බව.
    - ජේසුස් වහන්සේ විනිශ්චයට භාජනය වූ බව.
    - ජේසුස් වහන්සේ වැරදිකරුවකු ලෙස තීරණය වූ බව.
    - පෞද්ගලික වාසි උදෙසා තීන්දු ක්‍රියාත්මක වූ බව.
    - නිදොස් ජේසුස් වහන්සේ කුරුසි පත් කළ බව.
    - අසාධාරණය හමුවේ නො සැලී සිටිය යුතු බව

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම් :** ශුද්ධ බයිබලය- ශු. ලූක් 22:63- 23: 25, 23: 33, 23: 44-49.
උසාවියක පසුබිම දැක්වෙන පින්තූරයක්
A4 කඩදාසි හා පෑන්
ඇමුණුම: 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**
**ගවේෂණය සඳහා උපදෙස්**

**1 කණ්ඩායම** • ශු. ලූක් 22: 63-71 - ජුදා ශ්‍රේෂ්ඨාධිකරණය

**2 කණ්ඩායම** • ශු. ලූක් 23: 1-5, 23:13-25 - පිලාත් ඉදිරිපිට

**3 කණ්ඩායම** • ශු. ලූක් 23: 6-12 - හෙරොද් ඉදිරිපිට

**4 කණ්ඩායම** • ශු. ලූක් 23: 26-43 - කුරුසිපත් වීම

- ඔබ කණ්ඩායමට අදාළ බයිබල් පාඨය අධ්‍යයනය කොට ඊට අදාළ ජේසුස් වහන්සේ මුහුණ දුන් විනිශ්චය අවස්ථාව පිළිබඳ කෙටි නාට්‍ය පිටපතක් නිර්මාණය කරන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

අනුන් විනිශ්චය කිරීමට ඉක්මන් නොවීමට දරුවා යොමු කරවන්න.

**නිපුණතාව 2.0** : ජේසුස් වහන්සේගේ පරිපූර්ණ ජීවිතය හා සේවය තුළින් දිවි මග ආලෝකවත් කර ගනියි.

**නිපුණතා මට්ටම 10.2.13 :** කිතුනු දිවියට සාක්ෂි දරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 03

**ඉගෙනුම් පල**

- ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තියට සම්බන්ධ වූවන් පිළිබඳ කරුණු ගොනු කරයි.
- ක්‍රිස්තුස් වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයා බව පිළිගනියි.
- නිර්මාණාත්මක පොත් පිංචක් ඉදිරිපත් කරයි
- හෘද සාක්ෂියට එකඟව ක්‍රියා කරයි.
- කිතුනු සාක්ෂිකරුවන් ලෙස ජීවත් වෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පියවර : 1.

- පන්තියට ගෙන එන ලද ලී කුරුසිය සිසුන් ඉදිරියේ තබමින් කුරුසිපත් වීමට අදාළ ගීතිකාවක් ගායනා කරන්න.
- පහත කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාවක් මෙහෙය වන්න.
    - ජේසුස් වහන්සේ කුරුසිපත් කිරීමට කල්වරියේ ගොල්ගොතාවට ගෙන ගිය බව.
    - පේදුරු ජේසුස් වහන්සේගේ ප්‍රධානම ගෝලයා වූ බව
    - පේදුරු විසින් ජේසුස් වහන්සේ ක්‍රිස්තුස් වහන්සේ බව හඳුනා ගත් ආකාරය
    - අප කිතුනු සාක්ෂිකාරයන් විය යුතු බව

(මිනිත්තු 20)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 60 )

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.
    - ජේසුස් වහන්සේගේ කුරුසිපත් වීම - ශු. ලූක් 23: 34, 42, 46 පද
    - ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තියට ප්‍රතිචාර දැක්වූ අය
      පේදුරු -ශු. ලූක් 9: 18-20, 22: 31-34, 22: 54-62,
      සිරේනියේ සීමොන් - ශු. ලූක් 23: 26,
      ස්ත්‍රීන් ශු. ලූක් - 23: 27-31,
      සොරුන් - 23: 32-33, 23: 39-42,
      මුර සෙබළුන් - 23: 35-38,
      අරිමාතියේ ජෝසෙප් 23: 50-53,
    - අප ක්‍රිස්තුස් වහන්සේ උදෙසා සාක්ෂි දැරිය යුතු බව

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය- ශු. ලූක් 23ඃ 34,42,46 පද, 9ඃ 18-20, 22ඃ 31-34, 22ඃ 54-62, 23ඃ 26, ශු. ලූක් 23ඃ 27-31, 23ඃ 32-33, 23ඃ 39-42, 23ඃ 35-38, 23ඃ 50-53,
ලී කුරුසියක්
A4 කඩදාසි හා පෑන්
ඇමුණුමඃ 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1
## ගවේෂණය සඳහා උපදෙස්

ජේසුස් වහන්සේගේ කුරුසිපත් වීම හා සම්බන්ධව - ශු. ලූක් 23ඃ 34, 42, 46 පද

පේදුරු - ශු. ලූක් 9ඃ 18-20, 22ඃ 31-34, 22ඃ 54-62,

සිරේනියේ සීමොන් - ශු. ලූක් 23ඃ 26,

ස්ත්‍රීන් - ශු. ලූක් 23ඃ 27-31,

සොරුන් - ශු. ලූක් 23ඃ 32-33, 23ඃ 39-42,

මුර සෙබළුන් - ශු. ලූක් 23ඃ 35-38,

අරිමාතියේ ජෝසෙප් ශු. ලූක් 23ඃ 50-53,

- ඉහත බයිබල් පාඨයන් අධ්‍යයනය කරන්න.
- ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තියට සම්බන්ධ සිදුවීම් පෙළ ගස්වමින් පොත් පිංචක් නිර්මාණය කරන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

පවුලක් ලෙස කුරුසිපත් වීමට අදාළ චිත්‍රපටයක් නැරඹීමට යොමු වන්න.

**නිපුණතාව 2.0** : ජේසුස් වහන්සේගේ පරිපූර්ණ ජීවිතය හා සේවය තුළින් දිවි මග ආලෝකවත් කර ගනියි.

**නිපුණතා මට්ටම 10.2.14 :** ජීවමාන දෙවිඳුන් තුළ ජයග්‍රාහී ජීවිතයක් ලබයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 01

**ඉගෙනුම් පල**

- ජේසුස් වහන්සේගේ උත්ථානය අත්දුටු අය ගැන තොරතුරු ගොනු කරයි.
- ජේසුස් වහන්සේ මරණය පරාජය කොට නැවත නැගිටි බව පිළි ගනියි.
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඉදිරිපත් කරයි
- ජේසුස් වහන්සේ ජීවමාන තැනැන් වහන්සේ බව විශ්වාස කරයි. .
- නව බලාපොරොත්තුවක් ඇතිව ජයග්‍රාහී ව ක්‍රියා කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පියවර : 1.

- ඇමුණුම 2 ලබා දී ගායනා කරන්න සලස්වන්න.
- පහත කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාවක් මෙහෙය වන්න.
    - ජේසුස් වහන්සේ මරණය පරාජය කර නැගිටි බව.
    - ජේසුස් වහන්සේගේ උත්ථානය ස්ත්‍රීන් ප්‍රථමයෙන් දැනගත් බව
    - උත්ථානයේ සුපුවත ශ්‍රාවකයන් ප්‍රකාශ කළ බව

(මිනිත්තු 08)

පියවර 2

- ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න.
  (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 20)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.
    - ජීවමාන තැනැන්වහන්සේ විවිධ අයට ප්‍රකාශ වූ ආකාරය
      ස්ත්‍රීන්ට - ශු. ලූක් 24: 1-12
      එම්මාවුස් ගමන ශු ලූක් 24: 13-35
      ශ්‍රාවකයන්ට දර්ශනය ශු. ලූක් 24: 36-53
    - උන්වහන්සේ අප සමග ද වැඩ සිටින බව
    - උන්වහන්සේගේ නැවත නැගිටීම තුළින් අපට නව බලාපොරොත්තුවක් ඇති බව.
    - ජීවමාන තැනැන්වහන්සේ ව පෞද්ගලික ව අත්දැකිය යුතු බව.

(මිනිත්තු12)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය- ශු. ලූක් 24 පරිච්ඡේදය
A4 කඩදාසි හා පෑන්
ඇමුණුම: 1,
ඇමුණුම: 2,)

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1
## ගවේෂණය සඳහා උපදෙස්

**1 කණ්ඩායම** - ශු. ලූක් 24:1-12 දක්වා බයිබල් කොටස අධ්‍යයනය කරන්න.
- ඔබ ජේසුස් වහන්සේ බැලීමට සොහොන වෙත ගිය ස්ත්‍රීන් ගෙන් කෙනකු යයි සිතා ආත්ම ප්‍රකාශනයක් රචනා කරන්න.

**2 කණ්ඩායම** -ශු. ලූක් 24:13-35 දක්වා බයිබල් කොටස අධ්‍යයනය කරන්න.
- එම්මාවුස් ගමට ගිය ගෝලයින් සම්බන්ධ සිදුවීම නාට්‍ය පිටපතක් සේ රචනා කරන්න.

**3 කණ්ඩායම** -ශු. ලූක් 24:36-53 දක්වා බයිබල් කොටස අධ්‍යයනය කරන්න.
- උත්ථාන වූ ජේසුස්වහන්සේ ශ්‍රාවකයන්ට දර්ශනය වූ අයුරු දැක්වීමට නිර්මාණාත්මක ව කරුණු පෙළ ගස්වන්න.
(කවියක්/ගීතයක්/නිසඳැසක්)

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

## ඇමුණුම 2

මරුවා පරදා ජයගත් සමිඳා - නමදිමු නොමඳා සැවොම අදා
සොහොනින ඉරිදා අළුයම පැහැදා - නැගිටිනි පැළඳා සිරුර තෙදා

දූතයෙක් කදිමා විදුලිය සේමා - සගයෙන් මහිමා බැස නොපමා
ගල අහකට ලා සිටි සඳ ලකලා - මුරකරු ගොල්ලා බීත වෙලා

මළවුන් සේමා සිටියෝ සෑමා - හපනුන් මෙහෙමා නැත පුදුමා
දුවමින් බියෙනා නුවරට සැණිනා - දැන්නුවො සැමටා කරුණු සැමා

නොදාඩව් බොරු බස් මින් මතු අපහස් - සමිඳා ජේසුස් නැගිටි උසස්
ගෝල කතුන් විත් දැක හිමි පෙම්වත් - පළ කෙරුවෝ සත් හට පින්වත්

හලෙළුයා මේ ගී තුති දෙව් සත් - දෙව් පුත් ජේසුට තුටින මහත්
මරණින රුදු වන් ගලවන විලසින් - මාවත සුපසන් සාදා දුන්

ක්‍රිස්තියානි ගීතිකා පොතේ 159

**ගෙදර පරිසරයෙන්**

ඉරුදින ආගමික වතාවත් වලට මුල්තැන දීමට හුරු කරවන්න.

**නිපුණතාව 3.0** : ශුද්ධාත්මයාණන් වහන්සේ තුළින් දිරිය හා සවිය ලබමින් ජීවිත නවෝදයක් අත්දකියි.

**නිපුණතා මට්ටම 10.3.1** :ශුද්ධාත්මයාණන් වහන්සේගේ වැඩ සිරීම ට විවෘත වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 01

**ඉගෙනුම් පල**

- ජේසුස් වහන්සේ ගේ බෞතිස්මය පිළිබඳ කරුණු ගොනු කරයි.
- ශුද්ධාත්මයාණන් වහන්සේ නිරතුරුව ක්‍රියාකරන බව පිළිගනියි.
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඉදිරිපත් කරයි.
- යාච්ඤාව තුළින් ශුද්ධාත්ම ක්‍රියාකාරිත්වය අත්දැකිය හැකි බව විශ්වාස කරයි.
- සාමූහිකව ශුද්ධාත්මයාණන් වහන්සේට යාච්ඤා කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පියවර : 1.

- ජේසුස් වහන්සේගේ බෞතිස්මය ඇතුලත් පින්තූරයක් සිසුන් ඉදිරියේ ප්‍රදර්ශනය කරන්න.
- සිසුන්ට එය නිරීක්ෂණය කරන්න ඉඩ හරින්න.
- සිසුන්ගේ නිරීක්ෂණ ඇසුරෙන් පහත කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාවක් මෙහෙය වන්න.
    - ජේසුස් වහන්සේ ස්නාවක ජොහාන්තුමාගෙන් බෞතිස්මය ලැබූ බව.
    - ජේසුස් වහන්සේ යාච්ඤා කරමින් සිටින විට ශුද්ධාත්මයාණන් වහන්සේ පරෙවියකුගේ රූපාකාරයෙන් වැඩම කළ බව.
    - දෙවියන් වහන්සේගේ හඬ අහසින් ඇසුණු බව.
    - ශුද්ධාත්මයාණන් වහන්සේ ලෝකය තුළ ක්‍රියා කරන බව.

(මිනිත්තු 8)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න
- සෑම කණ්ඩායමකට ම ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 20 )

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.
    - ස්නාවක ජොහාන්තුමා පව් කමාවේ බෞතිස්මය සිදු කළ බව
    - පාප රහිත ජේසුස් වහන්සේ ස්නාවක ජොහාන්තුමාගෙන් බෞතිස්මය ලද බව.
    - පාප රහිත ජේසුස් වහන්සේ බෞතිස්මය තුළින් පාපි මිනිසා සමග

- ජේසුස් වහන්සේ ගේ බෞතිස්මය සුවිශේෂී සිදුවීමක් බව
- ජේසුස් වහන්සේ ගේබෞතිස්මයේදී ත්‍රිත්වයේ වැඩ සිටීම ප්‍රකාශ වූ බව
- යාච්ඤාවේ ක්‍රියාකාරී ජීවිතය ශුද්ධාත්ම වැඩ සිටීමට ඉඩ සලසන බව.

(මිනිත්තු 12)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය - ශු. ලූක් 3 : 21-22,
ජේසුස්වහන්සේ බෞතීස්මය ලබන දර්ශනය ඇතුලත් පින්තූරයක්
A4 කඩදාසි
ඇමුණුම: 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**ගවේෂණය සඳහා උපදෙස්**

ශු. ලූක් 3:21-22 ශුද්ධ ලියවිලි පාඨය හොඳින් කියවන්න.

පාඨයෙන් මතුවන කරුණු පිළිබඳව සාකච්ඡා කරන්න.

**කණ්ඩායම 1:** ශුද්ධ ලියවිලි පාඨයේ ඇති අවස්ථාවන් පෙළ ගස්වමින් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. ශු. ලූක් 3:21-22 සඳහන් වන ලෙසට ජේසුස් වහන්සේ ගේ බෞතිස්මය ට සම්බන්ධ විශේෂ සිදුවීම් මොනවා ද?
2. එම සිද්ධිය තුළ ත්‍රිත්වයේ වැඩ සිටීම කෙසේ හඳුනාගත හැකි ද?
3. ශුද්ධාත්මයාණන් වහන්සේගේ වැඩ සිටීමට විවෘත වීම සඳහා අප කළ යුත්තේ කුමක් ද?

**කණ්ඩායම 2:** 'ජේසුස් වහන්සේගේ බෞතිස්මයේ අරුත' යන මැයෙන්
පහත සඳහන් සැකිල්ල මත කිතුනු සඟරාවකට ලිපියක් ලියන්න.

ජේසුස් වහන්සේ ගේ සේවය ඇරඹීම
ස්නාවක ජොහාන් හා ජේසුස් වහන්සේ ගේ සබඳතාවය
ස්නාවක ජොහාන්ගෙන් බෞතිස්මය ලැබීමට හේතු

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

සභාව තුළ ඇති වත් පිලිවෙත් වලට එකඟව දිවි ගෙවීමට දරුවා යොමු කරවන්න.

**නිපුණතාව 3.0** : ශුද්ධාත්මයාණන් වහන්සේ තුළින් දිරිය හා සවිය ලබමින් ජීවිත නවෝදයක් අත්දකියි.

**නිපුණතා මට්ටම 10.3.2 :** පරීක්ෂා ජය ගැනීම ට ශුද්ධාත්ම මග පෙන්වීම ලබයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 01

**ඉගෙනුම් පල**

- ජේසුස් වහන්සේට පැමිණි පරීක්ෂාවන් හා ඉන් ජයගත් ආකාරය පිළිබඳ කරුණු ගොනු කරයි.
- පරීක්ෂාවන් ජය ගැනීමට දේව වචනය පිටිවහලක් වන බව පිළිගනියි.
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඉදිරිපත් කරයි.
- ශුද්ධාත්ම මග පෙන්වීමෙන් පරීක්ෂා ජයගත හැකි බව විශ්වාස කරයි.
- ජීවිත පරීක්ෂාවන්ගෙන් ජය ගනියි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පියවර : 1.

- සිසුන් කිහිප දෙනකුට තමන් ජීවිතයේදී මුහුණ දුන් පරීක්ෂාව බැගින් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාවක් මෙහෙය වන්න.
    - අපට විවිධ පරීක්ෂාවන් පැමිණෙන බව.
    - ජේසුස් වහන්සේට ද පරීක්ෂා පැමිණි බව.
    - දේව වචනය තුළින් පරීක්ෂා ජය ගත හැකි බව.

(මිනිත්තු 8)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න
- සෑම කණ්ඩායමකට ම ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 20 )

පියවර .3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.
    - ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් ජේසුස් වහන්සේ පාළුකරයට ගෙන ගිය බව
    - දින 40 ක් ජේසුස් වහන්සේ පාළුකරයේදී යාච්ඤාවේ යෙදී සිටි බව.
    - ජේසුස් වහන්සේ සාතන් විසින් පරීක්ෂා කළ බව.
    - ජේසුස් වහන්සේ පරීක්ෂා ජය ගත් බව.
    - විවිධ මාර්ග වලින් යක්ෂයා පරීක්ෂාවන් ගෙන එන බව.
    - මිනිසාගේ නමස්කාරය දෙවියන් වහන්සේට පමණක් හිමි විය යුතු බව.
    - ශුද්ධාත්ම මග පෙන්වීමෙන් පරීක්ෂා වලින් ජය ගත හැකි බව.

(මිනිත්තු 12)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය - ශු. ලූක් 4 : 1-13
A4 කඩදාසි හා පෑන්
ඇමුණුම: 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

### ඇමුණුම 1
### ගවේෂණය සඳහා උපදෙස්

- ශු. ලූක් 4:1-13 බයිබල් කොටස අධ්‍යයනය කරන්න.
- එහි අන්තර්ගතය පිළිබඳ සාකච්ඡා කරන්න.

**1 කණ්ඩායම**

- බයිබල් පාඨය අධ්‍යයනය තුළින් ජේසුස් වහන්සේට පැමිණි පරීක්ෂාවන් හඳුනාගෙන සටහන් කරන්න.
- ජේසුස් වහන්සේ පරීක්ෂාවන් සඳහා මුහුණ දුන් ආකාරය පිළිවෙළින් සටහන් කරන්න.
- පරීක්ෂාවට නොවැටීමට ජේසුස් වහන්සේට හැකිවූයේ කෙසේ ද යන්න ඉස්මතු කරමින් කිතුනු සඟරාවකට ලිපියක් සකස් කරන්න.

**2 කණ්ඩායම**

- සාමාන්‍ය ජීවිතයේදී ඔබ මුහුණ දෙන පරීක්ෂාවන් ද ඔබේ ආත්මික ජීවිතයට බාධා පමුණුවන පරීක්ෂාවන් ද ඒවායින් ජයගත හැකි ආකාරය ද වගු ගත කරන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

සන්නිවේදන මාධ්‍යයන් යෝග්‍ය ලෙස භාවිත කරන්න ට දරුවන් යොමු කරන්න.

**නිපුණතාව 3.0** : ශුද්ධාත්මයාණන් වහන්සේ තුළින් දිරිය හා සවිය ලබමින් ජීවිත නවෝදයක් අත්දකියි.

**නිපුණතා මට්ටම 10.3.3 :** නිවැරදි දැක්මක ට අනුව ජීවිතය ගොඩ නගා ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 01

**ඉගෙනුම් පල**

- රූප විපර්යාසය සිද්ධිය ගැඹුරින් අධ්‍යයනය කරයි.
- රූප විපර්යාසය සිදුවීම මගින් ශ්‍රාවකයන් නව දැක්මකට යොමු වූ බව පිළි ගනියි.
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඉදිරිපත් කරයි.
- ජේසුස් වහන්සේ දේව පුත්‍රයාණන් බව විශ්වාස කරයි.
- ජේසුස් වහන්සේගේ සේවයේ කොටස් කරුවන් වෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පියවර : 1.

- ජේසුස් වහන්සේගේ රූප විපර්යාසයට අදාළ පින්තූරයක් සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- එම පින්තූරය ඇසුරෙන් පහත කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාවක් මෙහෙය වන්න.
  - ජේසුස් වහන්සේ පේදුරු, ජාකොබ් හා ජොහාන් සමග කන්දකට නැගුණු බව.
  - ජේසුස් වහන්සේගේ දෙපැත්තෙන් මෝසෙස් හා එළියා දර්ශනය වූ බව.
  - උන්වහන්සේගේ වස්ත්‍ර දිදුලන්නට පටන්ගත් බව.

(මිනිත්තු 8)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න
- සෑම කණ්ඩායමකට ම ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 20 )

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.
  - ජේසුස් වහන්සේ යාච්ඤාවේ යෙදුන බව.
  - ජේසුස් වහන්සේ රූප විපර්යාසයට ලක් වූ බව.
  - උන්වහන්සේගේ මුහුණ හා වස්ත්‍ර වෙනස්වීම් වලට භාජනය වූ බව.
  - මෝසෙස් හා එළියා ව්‍යවස්ථාවලිය හා දිවැසාවලිය නියෝජනය කළ බව

- මෝසෙස් හා එලියා උන්වහන්සේගේ කුරුසි පූජාව ගැන කථාකරමින් සිටි බව.
- පේදුරු මණ්ඩප 3 ක් සෑදීමට යෝජනා කළ බව.
- ගෝල සමූහයට නිවැරදි දැක්මක් කරා යෑමට මෙම සිදුවීම පසුව ඉවහල් වන්නට ඇති බව.

(මිනිත්තු 12)

**ගුණාත්මක යෙදවුම් :** ශුද්ධ බයිබලය - ශු. ලූක් 9: 28-36

A4 කඩදාසි හා පෑන්

ඇමුණුම: 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**
**ගවේෂණය සඳහා උපදෙස්**

ශු. ලූක් 9:28-36 බයිබල් කොටස අධ්‍යයනය කරන්න.
එහි අන්තර්ගතය පිළිබඳ සාකච්ඡා කරන්න.

**1 කණ්ඩායම** - ● ජේසුස් වහන්සේගේ රූප විපර්යාසය සිදුවීම භූමිකා රංගනයක් තුළින් ඉදිරිපත් කරන්න.

**2 කණ්ඩායම** - ● ජේසුස් වහන්සේගේ රූප විපර්යාසය සිද්ධිය අධ්‍යයනය කර තමා පේදුරු යැයි සිතා එදා සිදුවීම පිළිබඳ ආත්ම ප්‍රකාශනයක් නිර්මාණය කරන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

නිවැරදි දැක්මකට අනුව ජීවිතය ගොඩනගා ගැනීමට යොමු කරවන්න.

**නිපුණතාව 4.0** : දේව රාජ්‍යයේ වටිනාකම් පෙරදැරි කරගෙන සදාචාරාත්මක සමාජයක් ගොඩ නැගීමට දායක වෙයි.

**නිපුණතා මට්ටම 10.4.1** :දේව රාජ්‍යය වර්ධනයට දායක වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02

**ඉගෙනුම් පල**

- දේව රාජ්‍යයේ වර්ධනය පිළිබඳ උපමා පැහැදිලි කර ගනියි.
- දේව රාජ්‍යය වර්ධනය වන බව පිළිගනියි.
- උපමා ඇසුරෙන් දේව රාජ්‍යයේ වර්ධනය පිළිබඳ පොත් පිංචක් නිර්මාණය කරයි.
- වත්මන් ලොව තුළ දේව රාජ්‍යය ව්‍යාප්ත වන බව විශ්වාස කරයි.
- දේව රාජ්‍යයේ වර්ධනය උදෙසා එකමුතු ව ක්‍රියා කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- අබ ඇට, මුහුන් (යීස්ට්) හා වී වපුරන ගොවියාගේ පින්තූරය පන්තිය තුළ, සිසුන් අතින් අත යවමින් එම දෑ පිළිබඳව අදහස් පළ කිරීමට සලස්වන්න.
- පහත කරුණ ඉස්මතු කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
    - අබ ඇටය ක්‍රමයෙන් විශාල පැළයක් බවට පත්වන බව.
    - මුහුන් දැමීමෙන් පිටි පිපෙන අයුරු
    - වී වපුරන ගොවීන් බොහෝ රටවල සුලබ දර්ශන බව.
    - වී වැපිරීම ගොවියාගේ ප්‍රධාන කාර්යයක් බව.
    - ජේසුස් වහන්සේ අබ ඇටය මුහුන් හා වපුරන්නා සම්බන්ධයෙන් උපමා පවසා ඇති බව.

(මිනිත්තු 10)

පියවර 2

- ශු. ලූක් 8:4-15 හා ශු. ලූක් 13:18-21 බයිබල් පාඨ සිසුන් දෙදෙනෙකු ලවා පන්තියට ඉදිරිපත් කරන්න.
- ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 30 )

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.
    - ජේසුස් වහන්සේ දේව රාජ්‍යයේ වර්ධනය දැක්වීම සඳහා අබ ඇටය හා මුහුන් උපමා යොදාගත් බව.
    - ජේසුස් වහන්සේ අබ ඇටයකට හා මුහුන් පිඩකට දේව රාජ්‍යය සමාන කළ බව (ශු. ලූක් 18:21)

- ජේසුස් වහන්සේ වපුරන්නාගේ උපමාව මගින් දේවරාජ්‍යයේ එල දැරීම පිළිබඳ අනාවරණය කළ බව. (ශු. ලූක් 8:4-15)
- දේව රාජ්‍යය සුළුවෙන් ඇරඹී වර්ධනයක් කරා ගමන් කරන බව.
- බාධක හා පසුබැසීම් නොතකා දේව රාජ්‍යය එල දරන බව.
- දේව රාජ්‍යය වත්මන් ලොව තුළ ද වර්ධනය කරා ගමන් කරන බව.
- කිතුනුවන් සිය ජීවිත තුළ පල දරමින් දේව රාජ්‍යයේ වර්ධනයට දායක විය යුතු බව.

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය - ශු. ලූක් 8: 4-15, 13:18-21
A 4කඩදාසි හා මාකර් පෑන්
අබ ඇට, මුහුන් හා වී වපුරන ගොවියකුගේ පින්තූරයක්
ඇමුණුම 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම .1.**
**ගවේෂණය සඳහා උපදෙස්**

තම කණ්ඩායමට අදාල බයිබල් පාඨය මනාව අධ්‍යයනය කරන්න.

**1 කණ්ඩායම -** ශු. ලූක් 13:18-19
**2 කණ්ඩායම -** ශු. ලූක් 13:20-21
**3 කණ්ඩායම -** ශු. ලූක් 8:4-15
බයිබල් පාඨ සාකච්ඡාවක් මෙහෙයවන්න.

තම කණ්ඩායමට අදාළ උපමාව ඇසුරෙන් දේව රාජ්‍යයේ වර්ධනය පිළිබඳ පොත් පිංචක් සකසන්න.
අදාළ පරිදි පහත මාතෘකා යොදන්න.

**1 කණ්ඩායම-** අබ ඇටයේ උපමාව හා දේව රාජ්‍යයේ වර්ධනය

**2 කණ්ඩායම -** මුහුන් පිළිබඳ උපමාව හා දේව රාජ්‍යයේ වර්ධනය

**3 කණ්ඩායම -** වපුරන්නා හා දේවරාජ්‍යයේ එල දැරීම

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

ගෙවත්තේ පැළ සිටුවීමට හා ඒවා රැක බලා ගැනීමට යොමු කරවන්න.

**නිපුණතාව 4.0** : දේව රාජ්‍යයේ වටිනාකම් පෙරදැරි කරගෙන සදාචාරාත්මක සමාජයක් ගොඩ නැගීමට දායක වෙයි.

**නිපුණතා මට්ටම 10.4.2 :** දේව රාජ්‍යයේ ලකුණු හා ප්‍රාතිහාර්ය තුළින් දේව බලය අත්දකියි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 03

**ඉගෙනුම් පල**

- දේව රාජ්‍යයේ ලකුණු හා ප්‍රාතිහාර්ය පිළිබඳ කරුණු ගොනු කරයි.
- ජේසුස් වහන්සේ බොහෝ ලකුණු හා ප්‍රාතිහාර්ය සිදු කළ බව පිළි ගනියි.
- දේවරාජ්‍යයේ ලකුණු හා ප්‍රාතිහාර්ය පිළිබඳ නිර්මාණාත්මක වාර්තා එළි දක්වයි.
- එදිනෙදා ජීවිතයේදී දේව බලය විශ්වාසයෙන් අත්දකියි.
- ලකුණු හා ප්‍රාතිහාර්ය අත්දකිමින් දේවරාජ්‍යයේ සේවය තුළ ක්‍රියාකාරී වෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- පන්තියට ගෙන එන ලද පුවත්පත්, අන්තර්ජාල තොරතුරු, පින්තූර ආදිය පිළිබඳ අදහස් සමස්ත පන්තිය සමඟ බෙදා ගැනීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ඒ ආශ්‍රයෙන් සංවාදයක් මෙහෙය වන්න.
- පහත කරුණු ඉස්මතු කිරීමට සලස්වන්න.
    - විවිධ රෝග හා ප්‍රශ්න හේතුවෙන් ලොව බොහෝ ජනතාවක් පීඩා විඳින බව.
    - බලාපොරොත්තු රහිතව බොහෝ ජනයා දිවි ගෙවන බව.
    - විශේෂයෙන් සොයා ගත් නව ඖෂධ ශල්‍ය කර්ම ආදිය නිසා මිනිසාගේ සුවයේ බලාපොරොත්තු ඉහළ නැංවී ඇති අයුරු.
    - දේව සේවකයන් හරහා දෙවියන් වහන්සේගේ ප්‍රාතිහාර්යය සුවය අත්දකින ජනතාවක් ලොව සිටින බව.
    - ජේසුස් වහන්සේ බොහෝ රෝග සුවකර ඇති බව.

(මිනිත්තු 15)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 65 )

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.

- ජේසුස් වහන්සේ සිදු කළ ලකුණු හා ප්‍රාතිහාර්ය බොහොමයක් සුභාරංචි පොත්වල සඳහන් වන බව.

- ජේසුස් වහන්සේ සිදු කළ ලකුණු හා ප්‍රාතිහාර්ය කොටස් 4ක් යටතේ වර්ග කළ හැකි බව.

  ජේසුස් වහන්සේ සොබාදහම අභිබවා දේව බලය විදහා දැක්වූ බව.
  -ශු. ලූක් 8: 22-25

  මාරුත දමනය හා පන්දහසකට කෑම දීම -ශු. ලූක් 9:10-17

  මිනිසුන් මළවුන්ගෙන් උත්ථාන කිරීමට ජේසුස් වහන්සේ යොමු වූ ආකාරය. -ශු. ලූක් 8:40-42, 8:11-17

  අශුද්ධාත්ම දුරු කිරීම තුළින් ජේසුස් වහන්සේ නපුරු බලවේග පරාජය

  කළබව.ශු.ලූක් 4:31-37,11:14-23

- බොහෝ රෝගීන් ජේසුස් වහන්සේ තුළින් සුවය අත්දුටු අයුරු
  ලූක් 18:35-43, ලූක් 7:1-10
- අපගේ ජීවිත තුළ දිනපතා ම දේව බලය අත්දැකීමට යොමු විය යුතු බව.

- ඇදහිල්ල තුළින් සමාජයේ නපුරු බලවේග පරාජය කිරීමට ප්‍රයත්න දැරිය යුතු බව.

- දේව රාජ්‍යයේ ලකුණු හා ප්‍රාතිහාර්ය අත්දකිමින් නිරතුරුව ම දේව රාජ්‍යයේ සේවයට යොමු විය යුතු අයුරු.

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම් :** ශුද්ධ බයිබලය -ශු. ලූක් 8:22-25, 9:10-17, 8:40-42, 49-56, 7:11-17,4:31-37, ශු. ලූක් 11:14-23, 18:35-43, 7:1-10

A 4 කඩදාසි හා මාකර් පෑන්

සුව කළ නොහැකි රෝග සඳහා, වත්මන් ලොව සොයාගෙන ඇති ඖෂධ වර්ග, ලෝකයේ විශ්ව කර්ම නිර්මාණ පිළිබඳ පුවත්පත්, අන්තර්ජාල තොරතුරු හා පින්තූර (මෙම තොරතුරු සොයා ගෙන නියමිත දිනට ගෙනෙන ලෙස සිසුන්ට පාඩමට පෙර සතියේ දැනුම් දෙන්න.)

ඇමුණුම 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 4:2:1.
## ගවේෂණය සඳහා උපදෙස්

තම කණ්ඩායමට අදාල බයිබල් පාඨය මනාව අධ්‍යයනය කරන්න.

**1 කණ්ඩායම -** ශු. ලූක් 8:22-25, 9:10-17 **2 කණ්ඩායම -** ශු. ලූක් 8:40-42, 49-56, 7:11-17
**3 කණ්ඩායම -** ශු. ලූක් 4:31-37, 11:14-23 **4 කණ්ඩායම -** ශු. ලූක් 18:35-43, 7:1-10

අදාළ බයිබල් පාඨ පිළිබඳ කණ්ඩායම තුළ සාකච්ඡා කරන්න.
තම කණ්ඩායමට දී ඇති මාතෘකාවට අනුකූලව නිර්මාණාත්මක වාර්තාවක් පිළියෙළ කරන්න.
අදාළ පරිදි පහත මාතෘකා යොදන්න.

**1 කණ්ඩායම-** සොබාදහම අභිබවා ප්‍රාතිහාර්යය.
**2 කණ්ඩායම -** මරණින් උත්ථාන කිරීමෙන් ප්‍රකාශිත දේව බලය.
**3 කණ්ඩායම -** දේව බලයෙන් අශුද්ධ බලවේග නසා දැමීම.
**4 කණ්ඩායම -** ප්‍රාතිහාර්ය තුළින් අත්දුටු සුවය.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

පවුලේ යැදුම් තුළදී රෝගීන් පිළිබඳව යාච්ඤා කිරීමට යොමු කරවන්න.

**නිපුණතාව 4.0** : දේව රාජ්‍යයේ වටිනාකම් පෙරදැරි කරගෙන සදාචාරාත්මක සමාජයක් ගොඩ නැගීමට දායක වෙයි.

**නිපුණතා මට්ටම 10.4.3 :** කිතුනු ප්‍රතිපත්ති අනුව ජීවත් වෙයි

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02

**ඉගෙනුම් පල**

- දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති විස්තර කරයි.
- දේව රාජ්‍යයේ ප්‍රතිපත්තිවලට අනුව දිවි ගෙවිය යුතු බව පිළි ගනියි.
- දේවරාජ්‍යයේ ප්‍රතිපත්ති ලැයිස්තුවක් නිර්මාණාත්මක ව ලියා දක්වයි.
- දේවරාජ්‍යයේ ප්‍රතිපත්ති අනුව දිවි ගෙවීමෙන් දිවිය යහ මගට යොමු වන බව විශ්වාස කරයි.
- ප්‍රතිපත්ති ගරුක ජීවිත ගත කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- 'ප්‍රතිපත්තියක්' යනු කුමක් ද යන්න පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡාවේ යෙදෙන්න.
- බ්‍රිස්ටල් බෝඩ් එකක් හුණු පුවරුවේ රඳවා සිසුන්ට තම ජීවිතයේ ඇති ප්‍රතිපත්තියක් බැගින් එහි සටහන් කිරීමට අවස්ථාව සලසන්න.
- පසුව සිසුන් ලියූ ප්‍රතිපත්ති ලැයිස්තුව හඩ නගා කියවීමට උපදෙස් දෙන්න.
- ඒ ආශ්‍රයෙන් සංවාදයක් මෙහෙය වන්න.
- පහත කරුණු ඉස්මතු කිරීමට සලස්වන්න.
    - ප්‍රතිපත්ති ජීවිතයට ඉතාම වැදගත් වන ආකාරය.
    - සෑම රටක් ම ප්‍රතිපත්ති ප්‍රකාශයකට හිමිකම් කියන බව
    - පෞද්ගලිකව අනන්‍යවූ ප්‍රතිපත්තීන් පවතින බව.
    - ප්‍රතිපත්ති මගින් ජීවිතය යහ මගට යොමු වන අයුරු.
    - ජේසුස් වහන්සේ කිතුනුවන්ට අදාළ ප්‍රතිපත්ති ප්‍රකාශ කළ බව.

(මිනිත්තු 10)

පියවර 2

- ශු. ලූක් 14: 15-24, හා ශු. ලූක් 15:1-32 බයිබල් පාඨ සිසුන් කීහිප දෙනකු ලවා පන්තියට ඉදිරිපත් කරවන්න.
- ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 40 )

පියවර 4:3:3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.

- දේව රාජ්‍යයට අදාළ ප්‍රතිපත්ති පවතින බව.
- ජේසුස් වහන්සේගේ උපමා තුළින් උන්වහන්සේ දේව රාජ්‍ය ප්‍රතිපත්ති පැහැදිලි කළ අයුරු
- මහා මංගල භෝජනය පිළිබඳ උපමාව තුළින් දේව රාජ්‍යයේ කැඳවීම අනාවරණය වන බව. - ශු. ලූක් 14:15-24
- දේව රාජ්‍යයට ආරාධනය දෙවියන් වහන්සේ නිකුත් කරන බව.
- දේව රාජ්‍යය සියල්ලන්ට ම විවෘත බව
- දේව රාජ්‍යයේ ආරාධනයට අප නිරතුරුව ම ප්‍රතිචාර දැක්විය යුතු බව.
- දේව රාජ්‍යයේ වැදගත් ප්‍රතිපත්ති එළි දැක්වෙන අයුරු.
  නැතිවූ පුත්‍රයා, නැතිවූ කාසිය හා නැතිවූ බැටලුවා යන උපමා කථා තුළින් ශු. ලූක් 15: 1-32
- දේව රාජ්‍යය තුළ එක් අයකුගේ නැතිවීම වුව ද එහි සම්පූර්ණත්වය ට අඩුවක් බව.
- නොමග ගිය පුද්ගලයකු සම්බන්ධයෙන් අප ප්‍රේමයෙන් ක්‍රියා කළ යුතු ආකාරය

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය - ශු. ලූක් 14 : 15 -24, 15: 1 - 32
බ්‍රිස්ටල් බෝඩ්
A4 කඩදාසි හා මාකර් පෑන්
ඇමුණුම 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**ගවේෂණය සඳහා උපදෙස්**

ශු. ලූක් 14:15-24, 15: 1-32 බයිබල් පාඨ නැවත කියවන්න.

ඒ ඇසුරෙන් **කිතුනුවන්ට අදාළ ප්‍රතිපත්ති** ලැයිස්තුවක් ලියා දක්වන්න

තම නිර්මාණ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

නොමග ගිය මිතුරන් ප්‍රේමයෙන් යහමගට ගෙන ඒම සඳහා දරුවන් යොමු කරවන්න.

**නිපුණතාව 4.0** : දේව රාජ්‍යයේ වටිනාකම් පෙරදැරි කර ගෙන සදාචාරාත්මක සමාජයක් ගොඩ නැගීමට දායක වෙයි.

**නිපුණතා මට්ටම 10.4.4 :** නිහතමානී ව තම හැකියාවන් දේව ගෞරවය උදෙසා කැප කරයි

**කාලච්ඡේද සංඛ්‍යාව :** 03

**ඉගෙනුම් පල**

- දේව රාජ්‍යයේ පුරවැසියන්ගේ ගුණාංග හා චරිත ලක්ෂණ පැහැදිළි කරයි.
- කිතුනුවන් නිහතමානී ව දේව ගෞරවය උදෙසා කැප විය යුතු බව පිළි ගනියි.
- නිර්මාණාත්මක නාට්‍ය පිටපතක් රචනා කරයි.
- යහගුණ වර්ධනය කර ගනිමින් සේවය කළ යුතු බව විශ්වාස කරයි.
- යහපත් සේවාවන් වල යෙදෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- සිසුන් කන්ඩායම් 4 කට වෙන් කොට එක් කණ්ඩායමක ට පින්තූර 2 බැගින් ලබා දෙන්න.
- කණ්ඩායම තුළ කෙටි සාකච්ඡාවකට මඟ පෙන්වන්න.
- සිසුන් දෙදෙනකුට එම පින්තූර පිළිබඳව අදහස් පළ කිරීමට අවස්ථාව ලබා දෙන්න
- පහත කරුණු ඉස්මතු කිරීමට සලස්වන්න.
    - මෙම පුද්ගලයන් විවිධ රටවලට අයත් බව.
    - ඔවුන් විවිධ ජාතීන් නියෝජනය කරන බව
    - ඔවුන්ගේ ජීවිත තුළින් යහපත් ගුණාංග එළි දැක්වුණු බව.
    - එම පුද්ගලයන් නිහතමානී ව ලොවට ඉමහත් සේවයක් ඉටු කළ අයුරු..

(මිනිත්තු 20)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 60)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.
    - දේව රාජ්‍යයේ පුරවැසි භාවය ලැබීම උතුම් වරප්‍රසාදයක් බව.
    - දේව රාජ්‍යයේ පුරවැසියන් තම ජීවිත තුළින් සුවිශේෂී ලක්ෂණ පිළිබිඹු කළ යුතු බව

- ජේසුස් වහන්සේ ඉගැන්වූ පරිදි දේව රාජ්‍යයේ පුරවැසියන් නිරතුරුවම යහපත් හා නිවැරදි දේ කළ යුතු බව.
- සේවක නායකත්වයක් ප්‍රගුණ කළ යුතු අයුරු. ශු. ලූක් 22:24-30.
- අන් අය වෙනුවෙන් වැය වීම. ශු. ලූක් 10:25-37
- ස්ථානෝචිත ප්‍රඥාවෙන් ක්‍රියා කිරීම දේව රාජ්‍යයේ පුරවැසියන්ගේ වගකීම බව. ශු. ලූක් 16:1-9
- දේව රාජ්‍යයේ පුරවැසියන් අන් අයගේ ජීවිත යහපත් ලෙස ගොඩ නැංවීම ට සිය හැකියාවන් කැප කළ යුතු බව. ලූක් 19:1-27
- කිතුනු ගුණාංග වර්ධනය කර ගනිමින් දේව ගෞරවය සඳහා සේවය කළ යුතු බව.

(මිනිත්තු 40

**ගුණාත්මක යෙදවුම්:** ශුද්ධ බයිබලය - ශු. ලූක් 22:24-30, 10:25-37, 16:1-9, 19:11-27
තෙරේසා මව්තුමිය, මහත්මා ගාන්ධි, මයිකල් රූදිගු පියතුමා, ඒබ්‍රහම් ලින්කන්, මාටින් ලූතර් කිං, ෆ්ලොරන්ස් නයිටිංගේල්, ජෝසප් වාස් පියතුමා, ඉව්ලින් කානි යන අයගේ පින්තූර
A4 කඩදාසි හා මාකර් පෑන්
ඇමුණුම 1)

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

.

**ගවේෂණය සඳහා උපදෙස්**

- තම කණ්ඩායමට අදාළ බයිබල් පාඨය කියවා කණ්ඩායම තුළ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- තමාට ලැබී ඇති මාතෘකාවට අදාලව නාට්‍ය පිටපතක් රචනා කරන්න.

**1 කණ්ඩායම -** ශු. ලූක් 22:24-30 - දෙව් රජයේ සේවකයෝ නායකයෝය.

**2 කණ්ඩායම -** ශු. ලූක් 10:25-37 - වැය වීමෙන් කැපවෙමු.

**3 කණ්ඩායම -** ශු. ලූක් 16:1-9 - ස්ථානෝචිත ප්‍රඥාවෙන් දෙව් රජයේ ක්‍රියා කරමු.

**4 කණ්ඩායම -** ශු. ලූක් 19:11-27 - හැකියාවන් සේවයට.
".

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

සැම විට අසල්වැසියන්ට උපකාර කිරීමට යොමු කරවන්න.

**නිපුණතාව 4.0** : දේව රාජ්‍යයේ වටිනාකම් පෙරදැරි කර ගෙන සදාචාරාත්මක සමාජයක් ගොඩ නැගීමට දායක වෙයි.

**නිපුණතා මට්ටම 10.4.5:** දේව රාජ්‍යයේ පුරවැසියන් ගේ භාර දූර කම ග්‍රහණය කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 03

**ඉගෙනුම් පල**

- දේව රාජ්‍යයේ අභියෝගාත්මක අවස්ථා පැහැදිලි කරයි.
- අභියෝග වලට මුහුණ දීමට සිදුවන බව පිළි ගනියි.
- දේව රාජ්‍යයේ පුරවැසි භාවය පතන අයට ජේසුස් වහන්සේගෙන් අභියෝග යන මාතෘකාව යටතේ රචනයක් ලියයි.
- අභියෝග ජය ගැනීමට ජේසුස් වහන්සේ දිරිය හා සවිය ලබා දෙන බව විශ්වාස කරයි.
- අභියෝග ජය ගනිමින් සහයෝගයෙන් ක්‍රියා කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස**

පියවර : 1

- අභියෝග ජයගැනීම පිළිබඳ පින්තූර සහිත කථාව පන්තියට ඉදිරිපත් කරන්න.
- එම කථාවේ තමා සිත් ගත් කොටස සටහන් කිරීමට උපදෙස් දෙන්න.
- සිසුන් ලියූ අදහස් පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න
- පහත කරුණු ඉස්මතු කරන්න.
    - සෑම පුද්ගලයකුට ම ජීවිත අභියෝග වලට මුහුණ දීමට සිදුවන බව.
    - විවිධ ආකාරයේ අභියෝග පවතින අයුරු.
    - වස්තුව බලය ආදිය ද අභියෝග ලෙස හැඳින්විය හැකි බව
    - ජීවිත අභියෝග ජය ගෙන ඉදිරියට යා යුතු බව.
    - අභියෝග වලට මුහුණ දීම තුළින් ජීවිතයට සවිය හා දිරිය ලැබෙන බව.
    - අභියෝග ජය ගැනීමට දෙවියන් වහන්සේ මග පෙන්වන බව.

(මිනිත්තු 20)

පියවර 2

- ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 60)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.

- දේව රාජ්‍යයේ පුරවැසියන්ගේ ජීවන රටාව පහසු නොවන බව.
- දේව රාජ්‍යයේ පුරවැසියන් ලෙස බොහෝ අභියෝගාත්මක අවස්ථාවන්ට මුහුණ දීමට සිදු වන බව.
- දේව රාජ්‍යයේ පුරවැසියන්ට මුහුණ දීමට සිදුවන අභියෝග පිළිබඳ ජේසුස් වහන්සේ අනතුරු ඇඟවූ ආකාරය.
- ජේසුස් වහන්සේගේ කුරුසිය දරා ගෙන උන්වහන්සේ අනුගාමී විය යුතු බව. ශු. ලූක් 9:57-62
- වස්තුව හා ලෞකික සැප සම්පත් කෙරෙහි සිය ජීවිත රැඳවීමේ ආදීනව. ශු. ලූක් 12:13-34, 18:18-30, 16: 19-31
- අධ්‍යාත්මිකව පරිපූර්ණ වීමේ අවශ්‍යතාවය.
- දේව රාජ්‍යයේ පුරවැසි භාවය ලබන තීරණයේ ඇති භාරදූර බව ශු. ලූක් 14:25-33
- නිහතමානි ව සේවය කිරීමේ වැදගත්කම
- සියලු අභියෝග ජය ගැනීමට ජේසුස් වහන්සේ සවිය හා දිරිය ලබා දෙන බව
- කිතුනුවන් දේව රාජ්‍යයේ පුරවැසියන් ලෙස එහි භාරදූර කම වටහා ගනිමින් දිවි ගෙවිය යුතු බව.

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම්:** ශුද්ධ බයිබලය - ශු. ලූක් 9:57-62, 12:13-34, 18:18-30, 16:19-31, 14:25-33, 18:9-14
අභියෝග ජය ගැනීම පිළිබඳ පින්තූර සහිත කථාවක්
A 4 කඩදාසි හා මාකර් පෑන්
ඇමුණුම 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1
## ගවේෂණය සඳහා උපදෙස්

.

ශු. ලූක් 9:57-62, 12:13-34, 18:18-30, 16:19-31, 14:25-33, 18:9-1
බයිබල් පාඨ අධ්‍යයනය කරන්න.

- දේව රාජ්‍යයේ පුරවැසි භාවය පතන අයට ජේසුස් වහන්සේගෙන් අභියෝග යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

".

තම නිර්මාණ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

ජීවිත අභියෝග වල දී ජේසුස් වහන්සේගෙන් දිරිය හා සවිය අයැදිමින් යාච්ඤා කිරීමට යොමු කරවන්න.

**නිපුණතාව 4.0** : දේව රාජ්‍යයේ වටිනාකම් පෙරදැරි කර ගෙන සදාචාරාත්මක සමාජයක් ගොඩ නැගීමට දායක වෙයි.

**නිපුණතා මට්ටම 10.4.6:** කිතුනුවන් ලෙස නිරතුරු සූදානමින් යුතු ව කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 03

**ඉගෙනුම් පල**

- දේව රාජ්‍යයේ පුරවැසියන් නිරතුරු සූදානමින් කටයුතු කළ යුතු ආකාරය පැහැදිලි කරයි
- සූදානම අත්‍යවශ්‍ය බව පිළි ගනියි.
- ගීතිකාවක් නිර්මාණය කරයි.
- සූදානමින් හා කැපවීමෙන් ක්‍රියා කරන අයට සදාතන ජීවනය උරුම කර ගත හැකි බව විශ්වාස කරයි.
- නිරතුරු සූදානමින් කටයුතු කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- කිසියම් සරල ක්‍රියාකාරකමක් කිරීමට සූදානම් වන ලෙස සිසුන්ට දැනුම් දෙන්න.
- A4කඩදාසි ලබා දී මිනිත්තු 2ක් ඇතුළත බෝට්ටුවක් හෝ අවානක් සෑදීමට උපදෙස් දෙන්න .
- නියමිත වේලාවට ක්‍රියාකාරකම නවත්වන්න.
- ඒ පිළිබඳ සංවාදයක් මෙහෙයවමින් පහත කරුණු ඉස්මතු කරන්න.

  - සෑම ක්‍රියාකාරකමකට ම පෙර සූදානම අත්‍යවශ්‍ය බව.
  - නිසි සූදානමින් පසුවන අයට නිසි පරිදි අදාළ ක්‍රියාවන් වල යෙදිය හැකි බව
  - සූදානමින් යුතුව කටයුතු කිරීමෙන් අභියෝග ජය ගත හැකි බව.
  - එදිනෙදා කටයුතු යහපත් අයුරින් සිදු කිරීමට නිසි පරිදි සූදානම් විය යුතු ආකාරය

(මිනිත්තු 20)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 60 )

පියවර 4.6.3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීම ට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.

- දේව රාජ්‍යයේ තීරණාත්මක අවස්ථා පිළිබඳව ජේසුස් වහන්සේ අනතුරු ඇඟවූ බව.

- ක්‍රිස්තුස් වහන්සේ නැවත වඩින මොහොත දක්වා දේව කැමැත්ත ඉටු කරමින් විශ්වාසවන්ත ව සිටිය යුතු අයුරු. ශු. ලූක් 12:35-40

- සදාතන ජීවනය ලබා ගැනීම සඳහා මනස්ථාපනය අත්‍යවශ්‍ය බව. ශු. ලූක් 13:1-9

- දේව රාජ්‍යයට පිවිසීම පටු දොරටුවකින් ඇතුල්වන්නාක් මෙන් දුෂ්කර බව. ශු. ලූක් 13:22-30

- දේව රාජ්‍යයේ සේවයට කැප වූ අය වඩාත් වගකීම් සහිත සේවයක් ඉටු කළ යුතු බව. ශු. ලූක් 12:42-48

- නිරතුරු සූදානමින් දේව රාජ්‍ය පුරවැසියන් ලෙස කටයුතු කළ යුතු බව.

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම් :** ශුද්ධ බයිබලය - ශු. ලූක් 12: 35-40, 13: 1-9, 13: 22-30, 12: 42-48,
A 4 කඩදාසි හා මාකර් පෑන්
ඇමුණුම 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

.

**ගවේෂණය සඳහා උපදෙස්**

- තම කණ්ඩායමට ලැබී ඇති ශුද්ධ ලියවිලි පාඨය හොඳින් අධ්‍යයනය කරන්න.

- ඒ පිළිබඳව සාකච්ඡාවක් මෙහෙය වන්න.

- එම අදහස් ඇසුරෙන්
  **සූදානමින් ජය ලබන දෙවි රජයේ පුරවැසියන්** යන මාතෘකාවට අදාළ ව ගීතිකාවක් නිර්මාණය කරන්න.

**1 කණ්ඩායම -** ශු. ලූක් 12:35-40

**2 කණ්ඩායම -** ශු. ලූක් 13:1-9

**3 කණ්ඩායම -** ශු. ලූක් 13: 22-30

**4 කණ්ඩායම -** ශු. ලූක් 12:42-48

තම නිර්මාණ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

පාසල් වැඩ කටයුතු සඳහා සැම විටම පෙර සූදානමකට යොමු කරවන්න.

**නිපුණතාව 5.0** : ශුද්ධ බයිබලය ජීවිතයට අත්වැලක් කර ගනියි.

**නිපුණතා මට්ටම 10.5.1** : දේව වදන් තුළින් ආලෝකයක් ලබයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 03

**ඉගෙනුම් පල**

- මිටියාවතේ දේශනය තුළ අඩංගු කරුණු වගු ගත කරයි.
- සතුරන් ට ප්‍රේම කළ යුතු බව පිළි ගනියි.
- නිර්මාණාත්මක ව ක්‍රියාකාරකම් ඉදිරිපත් කරයි
- දේව වචනය අනුව ජීවිතය ගොඩ නගා ගනියි.
- සමාජය තුළ අන් අය සමග සහයෝගයෙන් ජීවත් වෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පියවර : 1.

- ඇමුණුම 2 සහිත පත්‍රිකාව සිසුන් අතට පත්කර එය ගායනා කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ගීතිකාවේ සඳහන් පරිදි දේව වචනය ජීවිතයට වැදගත් වන ආකාරය පිළිබඳ සාකච්ඡාවක් මෙහෙය වන්න.
  - දේව වචනය අපගේ ජීවිතයට මග පෙන්වන බව.
  - දේව වචනය ට සවන් දී ඒ අනුව ක්‍රියා කළ යුතු බව.
  - සියලු දෙනාට ම ප්‍රේමය දැක්විය යුතු බව.
  - යහපත් ගුණාංග අප ජීවිත තුළින් පෙන්නුම් කළ යුතු බව.

(මිනිත්තු 15)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 65 )

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.
  - මිටියාවතේ දේශනය තුළ භාග්‍යයන් හතරක් සඳහන් වන බව.
  - ප්‍රේමය කිතුනු ජීවිතයේ පදනම බව.
  - අනුන් විනිශ්චය නො කළ යුතු බව.
  - දේව වචනය නැමැති ස්ථිර පදනම මත අපගේ ජීවිත ගොඩ නගා ගත යුතු බව.

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම් :** ශුද්ධ බයිබලය - ශු. ලූක් 6:17-49, 6:20-26, 6:27-36, 6:37-42, 6:43-45, 6:46-49
A4 කොළ හා පෑන්
ඇමුණුම 1
ඇමුණුම 2

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1

## ගවේෂණය සඳහා උපදෙස්

පහත සඳහන් බයිබල් කොටස් නිශ්ශබ්දව කියවන්න.

ශු. ලූක් 6: 17-49, 6:20-26, 6:27-36, 6:37-42, 6:43-45, 6: 46-49

ඉහත බයිබල් කොටස් අධ්‍යයනය කිරීම තුළින්,

- ඔබේ ජීවිතයට ආලෝකයක් ලබා ගත හැකි ආකාරය නිර්මාණාත්මක ව ඉදිරිපත් කරන්න. (කවියක්, විරිඳුවක්, නිසඳැසක්)

- සැපත හා විපත පිළිබඳ තොරතුරු වගු ගත කරන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

## ඇමුණුම 2

ඔබේ දෙව් වදන් දිව'ගට
මිහිරි රසය මුසු කරයි
කරුණා බර මොළොක් වදන්
අප මුව'ගට එක් කරයි

ගෙනෙයි වාසනා
දිවියට ගෙනෙයි වාසනා

ඔබේ දෙව් වදන් බිය සැක
දුක් කරදර දුරු කරයි
විපත් වලින් සුරැක නිතොර
ආලෝකය විහිදුවයි.

ගෙනෙයි වාසනා
දිවියට ගෙනෙයි වාසනා

ඔබේ දෙව් වදන් නිරතුරු
දිවි මං පිවිතුරු කරයි
පවින් මුදා ගුණෙන් සදා
සුමඟට අප යොමු කරයි

ගෙනෙයි වාසනා
දිවියට ගෙනෙයි වාසනා

ඔබේ දෙව් වදන් සොම්නස
සැනසුම් සුව සදාලයි
බේද අසමගිය දුරහැර
සාමය හද තුළ මවයි

ගෙනෙයි වාසනා
දිවියට ගෙනෙයි වාසනා

(ක්‍රිස්තියානි ගීතිකා පොතේ - 211)

**ගෙදර පරිසරයෙන්**

දරුවන් පවුලේ යාච්ඤාවේ දී බයිබලය කියවීමට යොමු කරන්න.

**නිපුණතාව 5.0** : ශුද්ධ බයිබලය ජීවිතයට අත්වැලක් කර ගනියි.

**නිපුණතා මට්ටම 10.5.2 :** ක්‍රිස්තුස් වහන්සේගේ ඉගැන්වීම් දෛනික ජීවිතයේ දී භාවිත කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 03

**ඉගෙනුම් පල**

- ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් වලින් ඉස්මතු වන කරුණු ගොනු කරයි.
- ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් පිළිපැදිය යුතු බව පිළිගනියි.
- ප්‍රශ්න මාලාවට පිළිතුරු ලියා දක්වයි.
- දේවාශීර්වාද වලට තුති පුදයි.
- ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් අනුව එකමුතුව ක්‍රියා කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පියවර : 1.

- ගෙනෙන ලද මැටි පහන් සිසුන් අතට පත්කර ඒවා දැල්වීමට උපදෙස් දෙන්න.
- භාජනයක ලුණු ස්වල්පයක් දියකර සිසුන්ට එහි රස බැලීමට අවස්ථාව දෙන්න.
- එම ක්‍රියාකාරකම් පිළිබඳව සිසුන්ට අදහස් පළකිරීමට සලස්වන්න.
- පහත කරුණු ඉස්මතු කරන්න.

  - අප ආලෝකයේ දරුවන් බවට පත් විය යුතු බව.
  - ලුණු මෙන් අප ජීවිත අන් අය වෙනුවෙන් වැය විය යුතු බව.
  - කිතුනු ගුණාංග අප ජීවිත තුළින් ඉස්මතු විය යුතු බව.
  - ජේසුස් වහන්සේගේ ඉගැන්විම් අප ජීවිත වලට අදාළ කර ගත යුතු බව.

(මිනිත්තු 15)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 65 )

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.

- අප නිරතුරුව දෙවිඳුන්ට තුති පිදිය යුතු බව. ශු. ලූක් 17:11-19
- ස්වාමින්ගේ යාච්ඤාව දිනපතා ජීවිතයට අවශ්‍ය බව. ශු. ලූක් 11:1-13, 18:1-8
- අප අන් අයගේ ජීවිත ආලෝකමත් කළ යුතු බව. ශු. ලූක් 8:16-18
- දෙවියන් වහන්සේ අපගේ අවශ්‍යතා සපයා දෙන බව. ශු. ලූක් 12:22-32
- සමාජයෙන් කොන්වූ අය කෙරෙහි සැලකිල්ලක් දැක්විය යුතු බව. ශු. ලූක් 14:7-11
- තමා සතු සියල්ල දෙවියන් වහන්සේට කැප කළ යුතු බව. ශු. ලූක් 21:1-4
- වැය වීමෙන් අප දෙවිඳුන්ට සේවය කළ යුතු බව. ශු. ලූක් 14:34-35
- ඇදහිල්ලෙන් යුතු ව ක්‍රියා කළ යුතු බව. ශු. ලූක් 17: 5-10

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය - ශු. ලූක් 11: 1-13, 18:1-8, 8:16-18, 14:7-11, 21: 1-4, 17:5-10, ශු. ලූක් 12:22-32, 14: 34-35, 17:11-19
මැටි පහන්, ලුණු
ඇමුණුම 1)

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාලව, ඉගෙනුම් ඵළ සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1
## ගවේෂණය සඳහා උපදෙස්

- පහත බයිබල් කොටස් හොඳින් කියවන්න.

| 1 කණ්ඩායම | 2 කණ්ඩායම | 3 කණ්ඩායම |
|---|---|---|
| ශු. ලූක් 11:1-13 | ශු. ලූක් 18:1-8 | ශු. ලූක් 21:1-4 |
| ශු. ලූක් 8:16-18 | ශු. ලූක් 14:7-11 | ශු. ලූක් 12:22-32 |
| ශු. ලූක් 14: 34-35 | ශු. ලූක් 17: 5-10 | ශු. ලූක් 17:11-19 |

- එම බයිබල් පාඨ වලට අනුව පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
  1. එම බයිබල් පාඨ වලින් ඉස්මතු වන ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් මොනවාද?
  2. ප්‍රායෝගික ජීවිතයේ දී එම ඉගැන්වීම් ක්‍රියාවලට නැංවිය හැකි අවස්ථා සඳහා නිදසුන් දෙන්න.
  3. ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් ක්‍රියාවට නැංවීමේ දී මුහුණ දීමට සිදුවන අභියෝග මොනවාද?
  4. දේව ආශිර්වාද වලට තුති පුදමින් යාච්ඤාවක් රචනා කරන්න.

ලියන ලද පිළිතුරු පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

දරුවන් පවුලේ යාච්ඤාවට දිනපතා යොමු කරවන්න.

# විවිධ සහය

| | | |
|---|---|---|
| පරිඝණක වදන් සැකසුම: | | ෂර්වෝන් මෙන්ඩිස් |
| කාර්යාලයීය කටයුතු | : | එස්. සී. ප්‍රියදර්ශනී මහත්මිය<br>ගාමිණී රෝහණ විමලසේන මහතා<br>ඩයස් අමරසිංහ මහතා<br>නිල්මිණී ප්‍රනාන්දු මහත්මිය |